# කාර්යසාධන වාර්තාව

# 2014

**විදේශ සම්පත් දෙපාර්තමේන්තුව**

ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව

©2014 විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
මහලේකම් කාර්යාලය (3 වැනි මහල)
තැ.පෙ. 277
කොළඹ 00100
ශ්‍රී ලංකාව

info@erd.gov.lk
http://www.erd.gov.lk

# අන්තර්ගතය


සමස්ත විග්‍රහය 01

සංවිධාන ව්‍යුහය 02

විදේශ මූල්‍යයනය 04


## එක් එක් අංශයන්හි කාර්යසාධනය


ආසියානු සංවර්ධන බැංකුව හා චීනය අංශය 11
- ආසියානු සංවර්ධන බැංකුව
- චීනය

ජපානය, කොරියාව, තායිලන්තය, වියට්නාමය, මැලේසියාව සහ සිංගප්පූරුව අංශය 19
- ජපානය
- කොරියාව

ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් අංශය 28

මැදපෙරදිග රටවල් සහ සාර්ක් කලාපයේ රටවල් අංශය 32
- මැදපෙරදිග රටවල්
- සාර්ක් කලාපයේ රටවල්

රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල් අංශය 41

එක්සත් ජාතීන්ගේ සංවිධාන සහ තාක්ෂණික ආධාර අංශය 45
- එක්සත් ජාතීන්ගේ සංවිධාන
- තාක්ෂණික ආධාර

ප්‍රාග්ධන වෙළඳපොළ අංශය 49

ණය කළමනාකරණ අංශය 52

ප්‍රතිපත්ති සැලසුම් අංශය 54

මූල්‍ය විග්‍රහය 55

# දැක්ම

ඉහළ මධ්‍යම ආදායම් මට්ටමට ශ්‍රී ලංකාව ළඟා වීමේදී අවශ්‍ය වන ආර්ථික වර්ධනය උදෙසා විදේශ මූල්‍ය සම්පත් ඒකරාශී කිරීම හා කළමනාකරණයට උචිත දැනුමෙන් හා නිපුනත්වයෙන් මනාව පරිපූර්ණ වීම.

# මෙහෙවර

රටේ දිගුකාලීන ණය පිළිබඳ තිරසාරභාවය පවත්වාගෙන යමින් ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන් සඳහා අවම පිරිවැයක් දරා විදේශ මුල්‍ය ඒකරාශී කිරීම.

# අපේ සේවාවන්

- සංවර්ධන ව්‍යාපෘති, හිතකර කොන්දේසි හා නියමයන් මත අවම පිරිවැයකින් හා අඩු අවදානමකින් යුතුව මූල්‍යයනය කිරීමට විදේශ මූල්‍ය සම්පත් ඒකරාශී කිරීම
- විදේශ සම්පත් ඵලදායී අන්දමින් හා කාර්යක්ෂම ලෙස වැයයෝජනය කිරීමට පහසු කිරීම
- දිගුකාලීන විදේශ ණය තිරසාර භාවයෙන් පවත්වා ගැනීමෙහිලා දායකවීම
- විදේශ පුහුණු අවස්ථා ඵලදායී ලෙස උපයෝගී කර ගැනීම තුළින් රාජ්‍ය අංශයේ මානව සම්පත් සංවර්ධනය සඳහා දායක වීම
- දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති වගකීම් සම්භාරය ඵලදායී ලෙස මෙන්ම සාර්ථක ලෙස ඉටු කිරීම උදෙසා දෙපාර්තමේන්තුවේ හැකියාවන් තවදුරටත් සවිමත් කිරීම

---

# අපේ සාරධර්ම

- සියලුම අණ පනත්වලට අවනත වෙමින් හෘද සාක්ෂියට අනුකූලව කටයුතු කිරීම, ඉතා උසස් මට්ටමේ යහපාලනය, විනිවිදභාවය හා අනාවරණය පිළිබඳ ප්‍රතිපත්තීන් පිළිපදිමින් ආචාරශීලීව කටයුතු කිරීම
- උසස් මට්ටමේ පුද්ගල එකමුතුභාවයට අනුකූලතාවයන් දක්වමින් පෞද්ගලික අභිලාෂයන්ට වඩා දෙපාර්තමේන්තුවේ අභිලාශයන්ට ප්‍රමුඛස්ථානය දීම
- කාර්ය මණ්ඩලයට ස්වකීය උපරිම කාර්යසාධන මට්ටම කරා ළඟාවීමට හැකිවන පරිදි සහ එම කාර්ය ප්‍රදර්ශනය කිරීමට හැකිවන ලෙස අන්‍යෝන්‍ය ගෞරවයෙන් හා විශ්වාසයෙන් කටයුතු කළ හැකි පරිසරයක් බිහිකිරීම
- සත්‍ය හා සාධාරණවූත්, ගණුදෙනු තුළින් සංවර්ධනය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්වකරුවන් සමඟ දිගුකාලීන යහපත් සබඳතා ප්‍රවර්ධනය කිරීම
- සෑම මට්ටමකම කාර්ය මණ්ඩලය සවිබලකරණය හා ඔවුන්ගේ කටයුතුවලට මැදිහත්වීම අවම කිරීම තුළින් ස්වකීය රාජකාරී සම්බන්ධව වගකිව යුතු බව ඒත්තු ගැන්වීම

# සමස්ත විග්‍රහය

රටේ දීර්ඝ කාලීන ණය තිරසාරත්වය පවත්වා ගනිමින් රටේ ආර්ථික වර්ධන වේගය ඉහළ දැමීමට අවශ්‍ය විදේශ මූල්‍යයනයන් ඒකරාශී කිරීම හා කළමනාකරණය කිරීම විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් කරනු ලබයි. තිරසාර ආර්ථික සංවර්ධන ඉලක්කයන් ළඟා කර ගැනීම සඳහා මෙන් ම දේශීය ඉතිරිකිරීම් හා ආයෝජන පරතරය අවම කිරීම උදෙසාත් රාජ්‍ය ආයෝජන ප්‍රමාණවත් මට්ටමක පවත්වා ගැනීම ඉතා අත්‍යාවශ්‍ය කරුණක් වන බැවින් ද්විපාර්ශ්වීය බහුපාර්ශ්වීය සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් ණය හා ප්‍රදාන වශයෙන් ලැබෙන විදේශීය සංවර්ධන සහයෝගීතාවයන් මෙරට සංවර්ධන මූල්‍ය අවශ්‍යතාවයන් සපුරාලීම උදෙසා විශේෂ කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

පසුගිය දශක කිහිපය තුළ ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය (IDA), ආසියානු සංවර්ධන බැංකුව (ADB), කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD), එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල (OFID), යුරෝපීය ආයෝජන බැංකුව වැනි බහුපාර්ශ්වීය සංවර්ධන පාර්ශ්වකරුවන් ද ජපානය, දකුණු කොරියාව, ප්‍රංශය, ඔස්ට්‍රියාව, ජර්මනිය, ඩෙන්මාර්කය, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, කුවේට්, සෞදි අරාබිය, නෙදර්ලන්තය, ස්වීඩනය, චීනය, ඉන්දියාව වැනි ද්විපාර්ශ්වීය සංවර්ධන පාර්ශ්වකරුවන් ද සහනදායි මූල්‍යයන් මෙරටට පිරිනමා ඇත. මෙම සංවර්ධන සහයෝගීතාවයන් ප්‍රදාන වශයෙන් දීර්ඝ කල්පිරීම් සහිත ණය ලෙසත්, අවම හෝ පොලී අනුපාතිකයන් රහිත මූල්‍යයන් ලෙසත්, මිශ්‍ර ණය ලෙසත් (ණය හා ප්‍රදාන වශයෙන් වූ) මෙරටට පිරිනමා ඇති අතර එම අරමුදල් දිළිඳුකම අඩු කිරීම, අධ්‍යාපන, සෞඛ්‍යය, විදුලිබල හා බලශක්ති, ජල සම්පාදන, මාර්ග හා පාලම්, අභ්‍යන්තර ප්‍රවාහනය, ගුවන් ගමනාගමනය වැනි ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය හා කෘෂිකාර්මික, වාරිමාර්ග හා පරිසර ආරක්ෂණය වැනි ක්ෂේත්‍රයන්හි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ද ආයෝජනය කරන ලදි.

මෙරට ඒකපුද්ගල ආදායමේ ක්‍රමික වර්ධනයත් සමඟම, පසුගිය වසර කිහිපය තුළ විදේශීය සංවර්ධනය මූල්‍යයන්හි සංයුතිය ද සැලකිය යුතු වෙනසකට භාජනය විය. සහනදායි විදේශ මූල්‍යයන් ලබාදීමේ ක්‍රමික අඩුවීමත් සමඟ, මෙරට රාජ්‍ය ආයෝජනය සඳහා අවශ්‍ය අරමුදල් සපුරා ගැනීමට අවශ්‍ය විකල්ප අවස්ථා පුළුල් කිරීමට අවශ්‍ය මූලික පියවර ගන්නා ලදි. එහිදී දැනට තිබෙන සහනදායී මූල්‍යයන ප්‍රභවයන්ගෙන් හා සහනදායි නොවන හා අඩු සහනදායී ණයවලින් සමන්විතවීම විධිමත් ණය මිශ්‍රණයක් තුළින් විදේශ මූල්‍යයන අවශ්‍යතා සපුරා ගැනීම කෙරෙහි අවධානය යොමු කරන ලදි. මෙම නව සංවර්ධන උපායමාර්ගත් සමඟ චීනය හා ඉන්දියාව වැනි රටවල් මෙරට නව සංවර්ධන පාර්ශ්වකරුවන් ලෙස නැගී සිටි අතර ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුවේ අන්තර්ජාතික සංවර්ධන සමායතනය, ජපානය පෙර පරිදිම මෙරටට අවශ්‍ය සංවර්ධන සහයන් ලබාදෙන ලදි. ඉහළ ඒක පුද්ගල ආදායමත් සමඟ, බටහිර ද්විපාර්ශ්වීය සහනදායි කොන්දේසි මත ඉන් මූල්‍යමය පහසුකම් අඩුකර ඇති අතර අපනයන ණය ලබාදීමේ වර්ධනයක් පෙන්නුම් කරනු ලැබේ. ඒ හා සමානව ආසියානු සංවර්ධන බැංකුව මෙරටට ලබාදෙන සහනදායි ණය අරමුදල් ප්‍රමාණය අඩුකර ඇති අතර සහනදායී නොවන මූල්‍යයන පහසුකම් ලබාදීමේ වර්ධනයක් පෙන්නුම් කරනු ලැබේ.

# සංවිධාන ව්‍යුහය

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ ජනරාල් ප්‍රමුඛ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වරයෙකුගෙන් සහ අධ්‍යක්ෂවරු හත් දෙනෙකුගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂවරුන් අංශ ප්‍රධානීන් ලෙස කටයුතු කරනු ලබන අතර, එම අංශයන් පහත පරිදි වේ;

- ආසියානු සංවර්ධන බැංකුව හා චීනය අංශය
- ජපානය, කොරියාව, තායිලන්තය, වියට්නාමය, මැලේසියාව හා සිංගප්පූරුව අංශය
- ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අංශය
- මැදපෙරදිග හා දකුණු ආසියානු රටවල් අංශය
- රුසියාව, ඕස්ට්‍රේලියාව හා බටහිර රටවල් අංශය
- එක්සත් ජාතීන්ගේ සංවිධාන හා ශිල්පීය ආධාර අංශය
- ප්‍රාග්ධන වෙළඳපොළ අංශය
- ණය කළමනාකරණ අංශය
- ප්‍රතිපත්ති සැලසුම් අංශය
- පරිපාලන හා ගිණුම් අංශය

පරිපාලන හා ගිණුම් අංශයන්, දෙපාර්තමේන්තුවේ සුමට හා කාර්යක්ෂම පැවැත්ම සහතික කිරීම සඳහා අවශ්‍ය සහායක සේවා සපයනු ලැබේ. එම සහයක සේවා යනු භෞතික හා මානව සම්පත් සංවර්ධනය හා කළමනාකරණය වේ. සේවාවන් සම්බන්ධ භෞතික සම්පත් සැපයීම කළමනාකරණය කිරීම හා නඩත්තුවත්, භාණ්ඩ සමීක්ෂණය පවත්වා භෞතික සම්පත් ලේඛනගත කිරීමත් 2014 වර්ෂය සඳහා සම්පූර්ණ කර ඇත.

2013 වර්ෂයේදී සියයට 24ක් වූ දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු ප්‍රතිශතය, 2014 වර්ෂයේ සියයට 30ක් දක්වා වැඩි වී තිබීම 2014 වාර්ෂික කාර්යසැලැස්මෙහි සඳහන් වූ ඉලක්කයන් ලඟාකර ගැනීමේදී අභියෝගයක්ව පැවතුණි. පුරප්පාඩු පැවතියද, 2014 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව ඉහළ කාර්යසාධනයක් වාර්තා කිරීමට සමත් විය.

## කාර්ය මණ්ඩල නිපුණතා සංවර්ධනය හා පුහුණු කිරීම

මානව සම්පත් සංවර්ධනය සඳහා දෙපාර්තමේන්තුව 2014 වර්ෂයේදී විශේෂ කාර්යභාරයක් ඉටු කරන ලදි. දේශීය හා විදේශීය පුහුණු අවස්ථා රාශියක් ලබාදීම මඟින් දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ කුසලතා වර්ධනය කර ගැනීමට සහ කාර්යක්ෂමතාවය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා කටයුතු කරන ලදි. ආයතනයේ නිලධාරීන්ට 2014 වර්ෂය තුළදී ලබාදෙන ලද දේශීය හා විදේශීය පුහුණු අවස්ථාවන් පහත සඳහන් පරිදි වේ;

**විධායක ශ්‍රේණියේ නිලධාරීන් වෙත ලබා දුන් දේශීය හා විදේශීය පුහුණු අවස්ථා**

| පුහුණු වැඩසටහන | පුහුණු කරන ලද කාර්ය මණ්ඩලය |
|---|---|
| කුඩා රාජ්‍යයන් සඳහා නවීන රාජ්‍යතාන්ත්‍රික උපායමාර්ග පිළිබඳ වැඩමුළුව - මෝල්ටාව | 1 |
| ආසියානු රටවල ODA නිලධාරීන් සඳහා වූ සම්මන්ත්‍රණය - චීනය | 2 |
| ණය කළමනාකරණ ප්‍රගතිය ඇගයීම පිළිබඳ පුහුණු වැඩසටහන - චීනය | 1 |
| ආසියානු කලාපීය රටවල රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ සිව්වන සම්මන්ත්‍රණය - ජෝර්ජියාව | 1 |
| දකුණු ආසියානු රටවල ආර්ථිකය ප්‍රතිනිර්මාණය කිරීම හා හැඩගැන්වීම පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය | 2 |

| පුහුණු වැඩසටහන | පුහුණු කරන ලද කාර්ය මණ්ඩලය |
|---|---|
| මැදි ආර්ථික තත්ත්වයේ සිට/කරා වන ගමන-රාජ්‍ය අංශයේ කළමනාකරුවන් සඳහා වන අභියෝග - චීනය | 1 |
| දකුණු ආසියානු රටවල යටිතල පහසුකම් සැලසුම්කරණය සහ ඉදිකිරීම පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය | 2 |
| ආසියානු සහ යුරෝපීය රටවල් සඳහා විදේශීය විශේෂඥ දැනුම හඳුන්වාදීමේ හා සමාජ ආර්ථික සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය | 1 |

දෙපාර්තමේන්තුවේ පරිපාලනය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් සහ කණිෂ්ඨ කාර්ය මණ්ඩලයේ සේවක මහතුන් 2014 වර්ෂයේදී දේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවීමට කටයුතු කරන ලදි. ඔවුන් පුහුණුව ලැබූ ක්ෂේත්‍ර පහත සඳහන් පරිදි වේ;

**සහය කාර්ය මණ්ඩලය වෙත ලබා දුන් දේශීය පුහුණු**

| පුහුණුව ලැබූ ක්ෂේත්‍ර | පුහුණු කරන ලද කාර්ය මණ්ඩලය |
|---|---|
| ප්‍රවාහන කළමනාකරණය | 1 |
| මූලික ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටිය | 1 |
| කාර්යාල කළමනාකරණය හා ආකල්ප සංවර්ධනය | 2 |
| වැටුප් පරිවර්තනය | 1 |
| සිවිල් විශ්‍රාම වැටුප් ගෙවීම හා පරිගණක ගත කිරීම | 3 |
| ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 1 |
| විනය කාර්ය පරිපාටිය | 1 |
| මූලික දෙමළ භාෂාව පිළිබඳ පාඨමාලාව | 2 |
| මුදල් රෙගුලාසි 104 යටතේ පරීක්ෂණ පැවැත්වීම | 1 |

# විදේශ මූල්‍යයනය


රාජ්‍ය ආයෝජන සැලකිය යුතු මට්ටමකින් පවත්වා ගනිමින් රටේ තිරසාර ආර්ථික සංවර්ධන ඉලක්කයන් ළඟා කර ගැනීම උදෙසා විදේශීය මූල්‍යයනය විශේෂ කාර්යභාරයක් ඉටුකරන අතර වර්තමානයේ මුළු රාජ්‍ය ආයෝජනයෙන් සියයට 50කට ආසන්න ප්‍රමාණයක් සපුරා ගනු ලබන්නේ විදේශ මූල්‍යයනය මඟිනි. රටට හිතකර කොන්දේසි හා නියමයන් හා අඩු අවදානමක් සහිත රටට අවශ්‍ය විදේශ මූල්‍යයන සම්පත් ඒකාරාශී කිරීම විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වන අතර 2014 වසරේ ද්විපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය සංවර්ධන පාර්ශ්වකරුවන් සමඟ එළඹී එකඟතාවයන් එම අරමුදල්වල උපයෝජනයන් හා ණය සේවාකරණය පිළිබඳ සාරාංශයක් මෙම පරිච්ඡේදය මඟින් විස්තර කෙරෙනු ඇත.

## විදේශ මූල්‍යයන එකඟතා

2014 වසරේ ශ්‍රී ලංකා රජය විදේශීය සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය දෙන නියෝජිතායතන සමඟ මූල්‍ය එකඟතාවයන් 51කට එළඹ ඇත. මේ තුළ ඇ.ඩො. මිලියන 1,500ක අන්තර්ජාතික බැඳුම්කර දෙකක් ද, සහිතව ඇ.ඩො. මිලියන 5,777.8කට අදාළව ණය ගිවිසුම් 34ක් සහ ඇ.ඩො. මිලියන 76.5කට අදාළව ප්‍රදාන 17ක් ද අන්තර්ගත වේ.


සංවර්ධන ව්‍යාපෘති/වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා 2014 වසර තුළ ලැබුණු සමස්ත එකඟතාවයන්ගෙන් ඉහළම ප්‍රතිශතයක් එනම් සියයට 52ක් චීනයෙන් ලැබී ඇති අතර ලෝක බැංකුව ආසියානු සංවර්ධන බැංකුව හා ජපානය සියයට 13, 12 හා 11ක දායකත්වයක් ලබා දී ඇත.

**සංවර්ධන පාර්ශ්වකරුවන් අනුව විදේශ මූල්‍යයන එකඟතා**




එසේම 2014 වසරේ සංවර්ධන පාර්ශ්වකරුවන් ලබාදීමට එකඟතාවය පළ කළ අරමුදල්වලින් සියයට 65කට වැඩි ප්‍රතිශතයක් (අන්තර්ජාතික බැදුම්කර නිකුතුවෙන් ලද මුදල් හැර) ආයෝජනය කර ඇත්තේ මෙරට මාර්ග හා පාලම් සංවර්ධනය කිරීම සඳහා වන අතර ජල සම්පාදන හා සනීපාරක්ෂක, ආපදා කළමනාකරණ හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර සඳහා ද සැලකිය යුතු අරමුදල් ප්‍රමාණයක් ලබාදීමට එකඟතාවය පළ කර ඇත.

**2014 තුළ පළ කරන ලද එකඟතා ආංශීය වශයෙන්**




# විදේශ මූල්‍යයන උපයෝජනය

2014 වසරේ ඇ.ඩො. මිලියන 1,395.29ක් මෙරට සංවර්ධන ව්‍යාපෘති සඳහා උපයෝජනය කර ඇති අතර ඉන් ඇ.ඩො. මිලියන 1,315ක් හෙවත් සියයට 94ක් ණය ලෙස ද ඉතිරි ඇ.ඩො. මිලියන 80.76ක් ප්‍රදාන ලෙස ද ලැබී ඇත.

2014 වසරේ සමස්ත උපයෝජනයන්ගෙන් වැඩිම ප්‍රතිශතයක් ඇ.ඩො. මිලියන 308.92ක් උපයෝජනය වී ඇත්තේ චීන රජයේ මූල්‍ය සහයෝගීතාවයෙන් ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා වන අතර ඇ.ඩො. මිලියන 247ක් හා 240ක් අනුපිළිවෙළින් ආසියානු සංවර්ධන බැංකුව හා ජපානය වෙතින් ලැබී ඇත.

**2014 වසරේ සංවර්ධන ව්‍යාපෘති සඳහා සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් සිදු කළ උපයෝජනයන් (මිලියන)**

| සංවර්ධන පාර්ශ්වකරුවන්/ ණය දෙන නියෝජිතායතන | ණය | | ප්‍රදාන | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | රුපියල් | ඇ.ඩො | රුපියල් | ඇ.ඩො | රුපියල් | ඇ.ඩො |
| **ද්විපාර්ශ්වීය** | **110,387.19** | **845.80** | **7,355.84** | **56.41** | **117,743.03** | **902.21** |
| චීනය | 40,315.24 | 308.92 | | | 40,315.24 | 308.92 |
| ජපානය | 31,308.09 | 239.89 | 2,179.01 | 16.68 | 33,487.10 | 256.57 |
| ඉන්දියාව | 15,076.92 | 115.50 | 3,564.71 | 27.35 | 18,641.63 | 142.85 |
| එක්සත් රාජධානිය | 7,268.92 | 55.69 | | | 7,268.92 | 55.69 |
| නෙදර්ලන්තය | 5,168.49 | 39.57 | | | 5,168.49 | 39.57 |
| දකුණු කොරියාව | 2,644.74 | 20.27 | | | 2,644.74 | 20.27 |
| හංගේරියාව | 659.18 | 5.05 | | | 659.18 | 5.05 |
| ස්වීඩනය | 467.22 | 3.58 | | | 467.22 | 3.58 |

| සංවර්ධන පාර්ශ්වකරුවන් ණය දෙන නියෝජිතායතන | ණය | | ප්‍රදාන | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | රුපියල් | ඇ.ඩො | රුපියල් | ඇ.ඩො | රුපියල් | ඇ.ඩො |
| ස්පාඤ්ඤය | 1,003.72 | 7.69 | | | 1,003.72 | 7.69 |
| ප්‍රංශය | 1,374.92 | 10.54 | | | 1,374.92 | 10.54 |
| ඔස්ට්‍රියාව | 894.08 | 6.85 | | | 894.08 | 6.85 |
| බෙල්ජියම | 453.29 | 3.48 | | | 453.29 | 3.48 |
| ඩෙන්මාර්කය | 285.53 | 2.19 | | | 285.53 | 2.19 |
| ජර්මනිය | 194.66 | 1.49 | 148.01 | 1.14 | 342.67 | 2.63 |
| කුවේට් | 193.76 | 1.48 | | | 193.76 | 1.48 |
| සෞදි අරාබිය | 1,415.21 | 10.84 | | | 1,415.21 | 10.84 |
| ඇමරිකා එක්සත් ජනපදය | 1,463.31 | 11.23 | 1,331.48 | 10.22 | 2,794.79 | 21.45 |
| ඕස්ට්‍රේලියාව | 199.91 | 1.54 | | | 199.91 | 1.54 |
| පාකිස්තානය | | | 132.63 | 1.02 | 132.63 | 1.02 |
| **බහුපාර්ශ්වීය** | **61,155.52** | **468.73** | **3,177.56** | **24.35** | **64,333.08** | **493.08** |
| ආසියානු සංවර්ධන බැංකුව | 32,225.24 | 247.07 | 934.64 | 7.16 | 33,159.88 | 254.23 |
| ලෝක බැංකුව - අන්තර්ජාතික සංවර්ධන සමායතනය | 21,084.19 | 161.5 | 2,011.39 | 15.42 | 23,095.58 | 176.92 |
| ලෝක බැංකුව - සංවර්ධනය හා ප්‍රතිසංස්කරණය සඳහා වූ අන්තර්ජාතික බැංකුව | 2,434.92 | 18.67 | | | 2,434.92 | 18.67 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික අරමුදල | 683.58 | 5.24 | 65.16 | 0.50 | 748.74 | 5.74 |
| අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල | 1,973.90 | 15.14 | | | 1,973.90 | 15.14 |
| යුරෝපීය ආයෝජන බැංකුව | 2,753.69 | 21.11 | | | 2,753.69 | 21.11 |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | | | 18.40 | 0.14 | 18.40 | 0.14 |
| එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ කොමිසම | | | 2.60 | 0.02 | 2.60 | 0.02 |
| එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල | | | 17.04 | 0.13 | 17.04 | 0.13 |
| ආහාර සහ කෘෂිකර්ම සංවිධානය | | | 128.33 | 0.98 | 128.33 | 0.98 |
| **එකතුව** | **171,542.71** | **1,314.53** | **10,533.40** | **80.76** | **182,076.11** | **1,395.29** |


**සටහන :**

1 මෙම වාර්තාව සඳහා යොදාගත් හුවමාරු අනුපාතිකයන් වනුයේ වසරේ අදාල ගිවිසුම් අත්සන් කළ දිනයේ විවිධ මුදල් වර්ග හා විනිමය අනුපාතිකයන් වේ.

2 රජය සතු ව්‍යාපාර විසින් ලබාගත් ණය මුදල්වල උපයෝජනයන් අන්තර්ගත කර ඇත.

2014 වසරේ උපයෝජනයන්ගෙන් සියයට 50කටත් වැඩි උපයෝජනයක් ප්‍රවාහන, මාර්ග හා පාලම් අංශයට ලැබී තිබීම සුවිශේෂී වේ.

2014 වසරේ විදේශ මූල්‍යයන උපයෝජනයේ ආංශික ව්‍යාප්තිය





## රජයේ විදේශ ණය ස්කන්ධය

2014 වසර අවසන් වන විට රාජ්‍ය විදේශ ණය ස්කන්ධය ඇ.ඩො. බිලියන 20.2ක් විය.[1] ඉන් සියයට 42ක් ද්විපාර්ශ්වීය සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් ලැබුණු අතර ඒ තුළ සියයට 30ක් ද්විපාර්ශ්වීය සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් ලබා ගත් සහනදායී ණය වන අතර සියයට 12ක් ද්විපාර්ශ්වීය අපනයන ණය වේ. බහුපාර්ශ්වීය සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් ලබා ගත් ණය සියයට 33ක් වන අතර සියයට 25ක් නිරූපණය වන්නේ අන්තර්ජාතික බැදුම්කරයන්ය.

1 සංවර්ධන ව්‍යාපෘති මූල්‍යකරණ සඳහා ලබාගත් ණය හා අන්තර්ජාතික හිමිකම් නිකුතුවෙන් ලබාගත් අරමුදල්වල ආපසු ගෙවීමට ඇති ණය මුදල් මෙහි අන්තර්ගත වේ. රජයේ ව්‍යාපාර විසින් ලබාගත් ණය හා භාණ්ඩාගාර බිල්පත් සඳහා ආපසු ගෙවීමට ඇති ණය මුදල් අන්තර්ගත වී නොමැත.


**රජයේ විදේශ ණය ප්‍රමාණයේ සංයුතිය**




## ණය සේවාකරණය

නිදහසින් පසු දශක හයක කාලය තුළ මෙරට සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් ලබා ගත් ණය ප්‍රමාණයේ ක්‍රමානුකූල වර්ධනයත් සමගම මෙරට මූල්‍ය හා පිස්කල් කළමනාකරණය තුළ ණය සේවාකරණය විශේෂ අංගයක් බවට පත් වී ඇත. මෙරට ආර්ථිකයට නිරන්තරයෙන් විදේශීය හා දේශීය ප්‍රභවයන්ගෙන් එල්ල වන කම්පනයන් තිබියදීත් ණය සේවාකරණ ගාස්තු නියමිත දිනට පියවමින් ශ්‍රී ලංකාව ණය ගෙවීම පැහැර නොහරින රටක් ලෙස අඛණ්ඩව කටයුතු කර ඇත.

**2007 සිට 2014 දක්වා ණය සේවාකරණ ගෙවීම් හා 2018 දක්වා පුරෝකතනයන් (ඇ.ඩො. මිලියන)**




2005 සිට 2014 දක්වා ඇ.ඩො. මිලියන 9,246[2] මුදලක් ණය සේවාකරණ ගෙවීම් ලෙස රජය විසින් ගෙවා ඇත. ඉන් ඇ.ඩො. මිලියන 6,424 ණය වාර සඳහා වන අතර පොලී ගෙවීම් සඳහා ඇ.ඩො. මිලියන 2,822 වැය කර ඇත. සංවර්ධන ව්‍යාපෘති සඳහා හා අන්තර්ජාතික බැදුම්කර සඳහා ණය සේවාකරණය වෙනුවෙන් ඇ.ඩො. මිලියන 1,259ක් 2014 වසරේ වැය කර ඇති අතර ඒ තුළ ණය වාර වෙනුවෙන් කළ ඇ.ඩො. මිලියන 788ක් හා පොලිය සඳහා වූ ඇ.ඩො. මිලියන 471ක් ද අන්තර්ගත වේ.

[2] භාණ්ඩාගාර බිල්පත් සඳහා සිදු කරන ලද ණය වාර හා පොලී සඳහා වූ ගෙවීම් අන්තර්ගත කර නොමැත.

# එක් එක් අංශයන්හි කාර්යසාධනය

# ආසියානු සංවර්ධන බැංකුව සහ චීනය අංශය

## ආසියානු සංවර්ධන බැංකුව

### ආසියානු සංවර්ධන බැංකුව සමඟ වන සංවර්ධන පාර්ශ්වකාරීත්වය

ආසියානු සංවර්ධන බැංකුව (ADB), ශ්‍රී ලංකාවේ බහුපාර්ශ්වික සංවර්ධන පාර්ශ්වකරුවන් අතුරින් ප්‍රමුඛම පාර්ශ්වකරුවෙකු වන අතර එය ශ්‍රී ලංකාව සමඟ වසර 48කට වැඩි ඵලදායී සබඳතාවක් පවත්වා ඇත. 1966 වර්ෂයේ දී ආසියානු සංවර්ධන බැංකුව ස්ථාපිත කළ දා පටන් මේ වන විට ණය ගිවිසුම් 171ක් යටතේ ඇ.ඩො. බිලියන 6.18ක මුදලක් ශ්‍රී ලංකාවේ සංවර්ධන කටයුතු වෙනුවෙන් ලබාදී ඇත. ඊට අමතර වශයෙන් ඇ.ඩො. මිලියන 358ක් මූල්‍ය ආධාර ලෙසද (ප්‍රධාන පාර්ශ්වකරු වන ආසියානු සංවර්ධන බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන සහ-මූල්‍ය ආධාරද ඇතුළත්ව) තාක්ෂණික සහයෝගීතා වැඩසටහන් 261ක් යටතේ තවත් ඇ.ඩො. මිලියන 124ක්ද ලබාදී ඇත. ශ්‍රී ලංකාව ආසියානු සංවර්ධන බැංකුවෙන් වාර්ෂිකව ලබාගන්නා වූ ණය මුදල් ප්‍රමාණය ඇ.ඩො. මිලියන 300කට ආසන්න අගයක් ගන්නා අතර එය දළ ජාතික නිෂ්පාදිතයෙන් 0.4-0.6ක ප්‍රතිශතයකි.


### දේශීය සහභාගීත්ව උපාය මාර්ග (CPS) - 2015-2017

ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ලබාගන්නා විදේශ මූල්‍යයනය උපයෝජනය කරගැනීම සඳහා සකස් කරන රජයේ මධ්‍යකාලීන ක්‍රමෝපායික හා මෙහෙයුම් වැඩසටහන ආසියානු සංවර්ධන බැංකුවේ සහයෝගීත්වය ඇතිව 2014 වසරේදී, 2015-2017 වර්ෂයන් ඉලක්ක කර ගනිමින් යාවත්කාලීන කරන ලදි. එම උපායමාර්ග ප්‍රධාන වශයෙන් (අ) පූර්ණ සහ තිරසාර ආර්ථික සංවර්ධනය (ආ) පුද්ගලික ආයෝජන උත්ප්‍රේරණය සහ රාජ්‍ය අංශයේ ආයෝජනයන්හි කාර්යක්ෂමතාවය ඉහල නැංවීම සහ (ඇ) මානව සම්පත් සංවර්ධනය යන අංශ කෙරෙහි අවධානය යොමු කරයි. ඒ අනුව, එය රටෙහි පරිනාමණය විදහාලමින් හා නිපුනතා සංවර්ධනය, ප්‍රවාහන සේවා හා තිරසාර බලශක්තිය ප්‍රශස්තිකරණය වැනි මැදි ආදායම් රටවල ප්‍රමුඛතා වැඩසටහන් කෙරෙහි යොමු කෙරෙයි. මෙම අංශවල සංවර්ධනය, වේගවත් ආර්ථික සංවර්ධනය හේතුවෙන් ඇතිවන එවැනි සේවාවන්හි ඉහළ ඉල්ලුම සපුරාලීම උදෙසා ඉතා වැදගත් වේ. 2015-2017 දක්වා යෝජනා කර ඇති සමස්ත ණය මුදල් ප්‍රමාණය ඇ.ඩො. බිලියන 1,123ක් වන අතර එයින් සැලකිය යුතු කොටසක් ජල සම්පාදනය, සනීපාරක්ෂාව හා අපජල කළමනාකරණ අංශය, විදුලිබල හා බලශක්ති අංශය හා අධ්‍යාපන හා නිපුනතා සංවර්ධන අංශය සඳහා භාවිතා කරනු ඇත.

### 2014 වර්ෂයේ එකඟතා හා උපයෝජනයන්

2014 වසරේ ආසියානු සංවර්ධන බැංකුව විසින් දක්වන ලද සම්පූර්ණ එකඟතාවය ඇ.ඩො. මිලියන 513කි. විදුලිබල හා බලශක්ති අංශය සඳහා ඇ.ඩො. මිලියන 150කින්ද, ජල සම්පාදනය සහ සනීපාරක්ෂක අංශය සඳහා ඇ.ඩො. මිලියන 88කින්ද, අධ්‍යාපන අංශය සඳහා ඇ.ඩො. මිලියන 100කින් සහ මාර්ග සහ ප්‍රවාහන අංශය සඳහා ඇ.ඩො. මිලියන 175කින්ද මෙම එකඟතාවය සමන්විත වේ. වර්තමාන මූල්‍යයන ව්‍යුහය තුළ ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබාගත් ණය ගිවිසුම් 33ක් ප්‍රදාන 5ක් ඇතුළත් වන අතර 2014 වසරේදී මෙම ණය යටතේ සිදුකරන ලද සමස්ත උපයෝජනය ඇ.ඩො. මිලියන 338ක් විය.


**2014 වසරේ සිදුකරන ලද සමස්ත උපයෝජනයන්හි ආංශික ව්‍යාපෘතිය**




## 2014 වසරේ ආසියානු සංවර්ධන බැංකු ණය කළඹ

ශ්‍රී ලංකාව සඳහා වන ආසියානු සංවර්ධන බැංකු ණය කළඹ ප්‍රධාන ක්ෂේත්‍ර 6ක් හරහා ව්‍යාප්ත වී ඇති අතර එයින් ජල සම්පාදන ක්ෂේත්‍රය සඳහා විශාලම දායකත්වය සැපයෙන අතර ඊට අමතරව පිළිවෙලින් මාර්ග හා ප්‍රවාහන විදුලිබල හා බලශක්ති, අධ්‍යාපනය හා නිපුණතා සංවර්ධනය, ප්‍රාදේශීය සංවර්ධනය අයත් වන බහු ආංශික ක්ෂේත්‍රය, මූල්‍ය කළමනාකරණය යන ක්ෂේත්‍ර සඳහා දායකත්වය ලබා දී ඇත. 2014 වසරේ දෙසැම්බර් 31 වන විට ආසියානු සංවර්ධන බැංකු ආයෝජනයෙහි ආංශික ව්‍යාප්තිය පහත රූපසටහන මඟින් නිරූපණය වේ.

**ආසියානු සංවර්ධන බැංකු ආයෝජනයන්හි ආංශික ව්‍යාපෘතිය (ඇ.ඩො. මිලියන)**



# 2014 වසරේ ක්‍රියාත්මක වූ ප්‍රධාන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | මුදල (ඇ.ඩො.මිලියන) |
|---|---|
| **ණය** | |
| මාර්ග පහසුකම් සැකසීමේ ව්‍යාපෘතිය | 15.0 |
| උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය | 154.0 |
| ජාතික මහාමාර්ග අංශික ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය 1 | 85.0 |
| උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | 98.0 |
| දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය | 75.0 |
| ද්විතීයික නාගරික සහ ග්‍රාමීය ප්‍රජාපාදක ජල සම්පාදන සහ සනීපාරක්ෂක ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | 17.6 |
| මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය | 88.0 |
| වියළි කලාපීය නාගරික ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 60.0 |
| යාපනය සහ කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 90.0 |
| වියළි කලාපීය නාගරික ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | 40.0 |
| මහ කොළඹ ජල සම්පාදන සහ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - අදියර 1 | 84.0 |
| මහ කොළඹ ජල සම්පාදන සහ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - අදියර 2 | 88.0 |
| පිවිතුරු බලශක්ති හා ප්‍රවේශ ප්‍රවර්ධන ව්‍යාපෘතිය | 160.0 |
| ධරණීය බලශක්ති අංශික සහයෝගීතා ව්‍යාපෘතිය | 120.0 |
| පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 130.0 |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතිය | 30.8 |
| "පුර නැගුම" පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 55.0 |
| අංශික නිපුණතා සංවර්ධන වැඩසටහන | 100.0 |
| අධ්‍යාපන අංශීය සංවර්ධන වැඩසටහන | 200.0 |
| **ප්‍රදාන** | |
| වියළි කලාපීය නාගරික ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 25.0 |
| යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයන්හි යුද ගැටුම්වලින් හානියට පත් ප්‍රදේශවල ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම | 2.0 |
| දැනුමැති සමාජයක් සඳහා අධ්‍යාපන ව්‍යාපෘතිය | 15.0 |
| පිවිතුරු බලශක්ති හා ප්‍රවේශ ප්‍රවර්ධන ව්‍යාපෘතිය | 4.2 |
| පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 1.5 |
| **එකතුව** | **1,738.1** |

# 2014 වසරේ අනුමත වූ හා ක්‍රියාකාරී වූ ණය ව්‍යාපෘති

ඇ.ඩො. මිලියන 457ක වූ ව්‍යාපෘති හතරක් 2014 වසර තුළ මුළු අගයකින් යුක්තව අනුමත කරන ලද අතර මුළු අගය ඇ.ඩො. මිලියන 263ක් වූ ව්‍යාපෘති තුනක් ක්‍රියාකාරී විය. අනුමත වූ ව්‍යාපෘතිවල මූල්‍ය අගයෙන් සියයට 45ක් මාර්ග හා ප්‍රවාහන ක්ෂේත්‍රයටද, සියයට 33ක් විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයට සහ සියයට 22ක් නිපුනතා සහ අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහාද විය.

**2014 වසරේ අනුමත වූ හා ක්‍රියාකාරී වූ ව්‍යාපෘති**

| ණය | මුදල (ඇ.ඩො.මිලියන) |
|---|---|
| **අනුමත වූ ව්‍යාපෘති** | |
| හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන - අදියර 1 | 150 |
| නිපුණතා ආංශීය වැඩිදියුණු කිරීමේ වැඩසටහන | 100 |
| ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - අදියර 1 | 100 |
| ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - අදියර 2 | 107 |
| **එකතුව** | **457** |
| **ක්‍රියාකාරී වූ ව්‍යාපෘති** | |
| ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන | 100 |
| දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය | 75 |
| මහ කොළඹ ජල සම්පාදනය ඉහළ නැංවීම සහ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අදියර 2 | 88 |
| **එකතුව** | **263** |

# 2015 වසරේ ක්‍රියාත්මක වීමට නියමිත ප්‍රධාන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | මුදල (ඇ.ඩො.මිලියන) |
|---|---|
| මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදනය ඉහල නැංවීම සහ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ වැඩසටහන - තෙවන අදියර | 128 |
| මහවැලි ජල ආරක්ෂණ ආයෝජන වැඩසටහන - අදියර 1 | 150 |
| ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - අදියර 2 | 107 |
| ප්‍රවාහන පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය | 15 |

# 2014 වසරේදී අවසන් වූ ආසියානු සංවර්ධන බැංකු මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ප්‍රතිඵලය |
|---|---|
| දැනුමැති සමාජයක් සඳහා අධ්‍යාපන ව්‍යාපෘතිය | අධ්‍යාපනයේ ගුණාත්මක භාවය, අදාළත්වය සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ ග්‍රාමීය සහ අඩු අවස්ථාවන් හිමි ප්‍රදේශවල සිසුන්ට ද්විතීයික හා තෘතීයික අධ්‍යාපනය සඳහා සම අවස්ථාවන් ලබාදීම. |
| නැගෙනහිර හා උතුරුමැද පළාත් මාර්ග ව්‍යාපෘතිය | (i) නැගෙනහිර හා උතුරුමැද පළාත්වල මාර්ග ජාලය වැඩිදියුණු කිරීම<br>(ii)මාර්ග සංවර්ධනය පිළිබඳ ආයතනික ධාරිතාවය පළාත් මට්ටමින් වැඩිදියුණු කිරීම |
| ද්විතීයික නාගරික සහ ග්‍රාමීය ප්‍රජාපාදක ජල සම්පාදන සහ සනීපාරක්ෂක ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශයේ පුද්ගලයින් 946,000කට ආරක්ෂිත නල ජලය සැපයීම හා පුද්ගලයින් 171,500කට සනීපාරක්ෂක පහසුකම් සැපයීම |
| ගැටුම් වලින් හානියට පත් ප්‍රදේශ සඳහා හදිසි අවශ්‍යතා ව්‍යාපෘතිය | ගැටුම් වලින් හානියට පත් ප්‍රදේශවල ජනජීවිතය යථා තත්ත්වයට පත්කිරීම හා වැඩිදියුණු කිරීම, ආර්ථික යටිතල පහසුකම්, පරිපාලන හා නීති සේවා පහසුකම් වැඩිදියුණු කිරීම |

## 2014 වසරේ විශේෂ අවස්ථා

- මැයි - කසකස්තානයේ අස්ටානා නුවර පවත්වන ලද 47 වන ආසියානු සංවර්ධන බැංකු සමුළුව

- <u>ණය ගිවිසුම් අත්සන් කිරීම</u>:

  - මැයි - ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන (ඇ.ඩො. මිලියන 100)
  - මැයි - දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය (ඇ.ඩො. මිලියන 75)
  - ජූනි - මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදනය ඉහල නැංවීම සහ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ වැඩසටහන - දෙවන අදියර (ඇ.ඩො. මිලියන 88)
  - නොවැම්බර් - ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - පළමු අදියර (ඇ.ඩො. මිලියන 100)
  - නොවැම්බර් - හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන (ඇ.ඩො. මිලියන 150)

- <u>ඉහළ පෙලේ උපදේශන කටයුතු සඳහා පැමිණි දූත කණ්ඩායම්</u>:

  - ජනවාරි - ආසියානු සංවර්ධන බැංකුවේ උප සභාපති වෙන්කායි සැන්ග් මහතා සහ දකුණු ආසියානු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ජුආන් මිරැන්ඩා මහතාගේ පැමිණීම
  - මාර්තු - ආසියානු සංවර්ධන බැංකුවේ විධායක අධ්‍යක්ෂ යෝ කුවැන් යූන් මහතාගේ පැමිණීම
  - මැයි - ආසියානු සංවර්ධන බැංකුවේ, දකුණු ආසියානු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ජුආන් මිරැන්ඩා මහතා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හන්කිම් මහතා, ආසියානු සංවර්ධන බැංකු මූල්‍යයනය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති විමර්ශනය සඳහා පැමිණීම.

- ජූනි - ආසියානු සංවර්ධන බැංකු සභාපතිතුමන් වන ටකේහිකෝ නකාවෝ මහතාගේ ප්‍රථම ශ්‍රී ලංකා සංචාරය
- අගෝස්තු - සාර්ක් කලාපීය රටවල අගවිනිසුරුවරුන්ගේ සාකච්ඡාවක් සඳහා ආසියානු සංවර්ධන බැංකු උප සභාපති (පරිපාලන හා සංයුක්ත කළමනාකරණ) බෲස් එල් ඩේවිස් මහතාගේ පැමිණීම.
- නොවැම්බර් - ආසියානු සංවර්ධන බැංකු උප සභාපති (දැනුම කළමනාකරණය හා තිරසාර සංවර්ධනය) බිංදු එන්. ලොහානි මහතාගේ පැමිණීම. ආසියා පැසිෆික් ව්‍යාපාරික සමුළුව සඳහා ද සහභාගී විය.
- නොවැම්බර් - ආසියානු සංවර්ධන බැංකු උප සභාපති වෙන්කායි සැන්ග් මහතා, මහාමාර්ග ලේකම් කාර්යාල ගොඩනැගිල්ල විවෘත කිරීම සඳහා පැමිණීම.

2014 වසරේදී ඉහළ පෙලේ උපදේශන කටයුතු සඳහා පැමිණි දූත කණ්ඩායම් ඇතුළුව ආසියානු සංවර්ධන බැංකුවේ දූත පිරිස් 102ක් පැමිණීම


# චීනය

ශ්‍රී ලංකා රජය ප්‍රදාන සහ ණය ස්වරූපයෙන් චීනය වෙතින් මූල්‍යාධාර ලබාගනී. ප්‍රදාන මෙන්ම පොලී රහිත ණය චීන රජය වෙතින් දෙනු ලබන අතර චීන ආනයන-අපනයන බැංකුව (EXIM), චීන සංවර්ධන බැංකුව (CDB) සහ චීන කර්මාන්ත හා වාණිජ බැංකුව (ICBC) වෙතින් ලබාදේ.

2010-2014 දක්වා වූ පසුගිය වසර 5 තුළ චීනයෙන් කරන ලද මුළු එකඟතාවය ඇ.ඩො. මිලියන 5,806ක් විය. පසුගිය වසර 5ක කාලය තුළ සිදුකරන ලද මුළු එකඟතාවයෙන් ඉහළම එකඟතාවය 2014 වසරේ දී සිදුකර ඇත. එය ඇ.ඩො. මිලියන 2,612ක් වූ අතර එයට සමගාමීව පිළිවෙළින් 2012 සහ 2010 වර්ෂවලදී ඇ.ඩො. මිලියන 1,056ක හා 829ක එකඟතාවයන් සිදුකර ඇත. 2014 වසරේ චීන ආනයන අපනයන බැංකුව සමඟ පිටත වටරවුම් අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අදියර III සඳහා ද දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය (අදියර 1 සහ 4) සඳහා ද හම්බන්තොට ජාත්‍යන්තර කේන්ද්‍රයේ මාර්ග සහ ගුවන් පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ද එකඟතාවයන් සිදුකර ඇති අතර, චීන සංවර්ධන බැංකුව සමඟ ප්‍රමුඛතා මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය III (අදියර I සහ II) සඳහා එකඟතාවයන් ද සිදු කරන ලදි.

චීනයෙන් ලද මූල්‍ය ආධාර මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතින් මඟින් පසුගිය වර්ෂ පහක කාලයේ දී වාර්තා කරන ලද සමස්ත උපයෝජනය ඇ.ඩො. මිලියන 3,745ක් විය. 2014 වසර තුළ වාර්තා වූ සමස්ත උපයෝජනය ඇ.ඩො. මිලියන 533.5[3]ක් වන අතර මෙම අගයෙන් ඇ.ඩො. මිලියන 147ක් වන ඉහළම උපයෝජනය හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියෙන් වාර්තා විය. තව ද ප්‍රමුඛතා මාර්ග වැඩිදියුණු කිරීම ව්‍යාපෘතිය-2 සහ පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය අදියර II මඟින් වාර්තා කරන ලද උපයෝජනයන් පිළිවෙලින් ඇ.ඩො. මිලියන 113.5ක් සහ ඇ.ඩො. මිලියන 51ක් විය.

2010 සිට 2014 දක්වා එකඟතා සහ උපයෝජනයන් (ඇ.ඩො. මිලියන)





[3]රජය සතු ව්‍යාපාර විසින් ලබාගත් ණය මුදල්වල උපයෝජනයන් අන්තර්ගත කර ඇත.

## ආංශික ව්‍යාප්තිය

පසුගිය වසර පහක කාලය තුළ චීනයේ සහාය ප්‍රධාන වශයෙන්ම ලබා ගන්නා ලද්දේ මාර්ග හා පාලම්, විදුලිබල හා බලශක්ති සහ වරාය හා ගුවන්සේවා යන අංශයන් සංවර්ධනය කිරීම සඳහාය. සංවර්ධන ව්‍යාපෘති සඳහා චීනයෙන් ලබා ගන්නා ලද මූල්‍යමය එකඟතාවයන්ගෙන් උපයෝජනය නොවූ ශේෂය වර්තමානයේදී ඇ.ඩො. මිලියන 3,020ක අගයක් ගනී. මෙම මුදලින්, ඉහළම අගය එනම් ඇ.ඩො. මිලියන 2,330ක් (සමස්ත මුදලෙන් සියයට 77ක්) මාර්ග හා පාලම් අංශය තුළ වාර්තා වන අතර සමස්ත අගයෙන් සියයට 9ක් වන දෙවන විශාලතම අගය වරාය හා නාවික අංශය යටතේද සියයට 5.5ක අගයක් ගන්නා තෙවන විශාලතම අගය දුම්රිය මාර්ග අංශය යටතේද වාර්තා විය.

**උපයෝජනය නොවූ ශේෂයෙහි ආංශික ව්‍යාප්තිය**




චීන අරමුදල් යටතේ 2014 වසර තුළ පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කරන ලදී.

- පිටත වටරවුම් අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අදියර III
- දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියේ පළමු වන කොටස - මාතර සිට බෙලිඅත්ත දක්වා ඉදිකිරීමේ ව්‍යාපෘතිය.
- දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියේ හතර වන කොටස - මත්තල සිට අන්දරවැව හරහා හම්බන්තොට දක්වා කොටස ඉදිකිරීමේ ව්‍යාපෘතිය.
- හම්බන්තොට ජාත්‍යන්තර කේන්ද්‍රයේ මාර්ග සහ ගුවන් පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය.
- ප්‍රමුඛතා මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය III (අදියර I).
- ප්‍රමුඛතා මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය III (අදියර II).

# ජපානය, කොරියාව, තායිලන්තය, වියට්නාමය, මැලේසියාව සහ සිංගප්පූරුව අංශය


## ජපානය

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සංවර්ධන පාර්ශ්වකරුවකු ලෙස දශක 6කට අධික දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියන ජපන් රජය තම නිල සංවර්ධන සහයෝගීතාවය ණය, ප්‍රදාන ආධාර, තාක්ෂණික සහයෝගීතාවය හා සංවර්ධන අධ්‍යයනයන් යන ආකාර ඔස්සේ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (JICA) හරහා ලබාදේ. 2014 දෙසැම්බර් මාසය වන විට, සමස්ත ජපාන ආයෝජන කළඹ ඇ.ඩො. මිලියන 2,443.1ක වටිනාකමකින් සමන්විත වන අතර එය ඇ.ඩො. මිලියන 2,341.5ක වටිනාකමකින් සමන්විත ණය ව්‍යාපෘති 21කින් හා ඇ.ඩො. මිලියන 101.6ක වටිනාකමකින් සමන්විත ප්‍රදාන ආධාර ව්‍යාපෘති 11කින් ද සමන්විත වේ.

ජපාන ආයෝජන කළඹ රජයේ සංවර්ධන ප්‍රමුඛතාවයන්ට සමගාමීව ක්‍රියාත්මක වන අතර එම ක්ෂේත්‍රයන් අතර සමබරතාවය පවත්වා ගනිමින් විදුලිබල හා බලශක්ති, ජල සම්පාදනය, මහාමාර්ග, වරාය හා ගුවන්සේවා, සෞඛ්‍යය, කෘෂිකර්මාන්තය, වාරිමාර්ග, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර මෙන්ම ආපදා කළමනාකරණය වැනි ප්‍රමුඛ ක්ෂේත්‍රයන් ආවරණය කරනු ලබයි.

### 2014 වසරේදී ජපාන සංවර්ධන සහයෝගීතාවය


2011 වසරේදී ඇ.ඩො. මිලියන 523ක විශාලතම ද්විපාර්ශ්වික සහයෝගීතාවය වාර්තා කරමින් මේ වන විට ඇ.ඩො. මිලියන 350-400 පරාසයේ සිට ඇ.ඩො. මිලියන 500කට අධික ප්‍රමාණයක් දක්වා ජපාන වාර්ෂික යෙන් ණය පැකේජය වර්ධනය වී ඇත. එමෙන්ම, 2014 වසරේදී පවත්නා ජපාන ආයෝජන කළඹ ඇ.ඩො. මිලියන 475ක වටිනාකමකින් යුත් සහණදායී ණය ව්‍යාපෘති 2ක් හා ඇ.ඩො. මිලියන 6.54ක වටිනාකමකින් යුත් ප්‍රදාන ආධාර ව්‍යාපෘති 2ක් ආශ්‍රයෙන් තවදුරටත් වර්ධනය කර ඇත. පසුගිය වසර 10ක කාලයේදී ජපන් රජය මගින් ලබාදුන් වාර්ෂික එකඟතා වටිනාකමෙහි සාමාන්‍ය ඇ.ඩො. මිලියන 308ක් වේ.



# 2014 වසරේ සමස්ත එකඟතාවය සහ උපයෝජනය

2014 වසරේ සමස්ත ජපාන එකඟතාවය අධ්‍යාපනය හා වෘත්තීය පුහුණු, සෞඛ්‍යය හා සමාජ සුභසාධනය, මහාමාර්ග හා පාලම්, ජනමාධ්‍ය යන ප්‍රමුඛ සංවර්ධන ක්ෂේත්‍රයන් කෙරෙහි යොමු වී ඇත.

**2014 වසරේ ජපාන සමස්ත එකඟතාවයෙහි ආංශික ව්‍යාප්තිය**




ශ්‍රී ලංකා රජය විසින් ජපාන නිල සංවර්ධන සහයෝගීතාවයෙහි 45 වැනි යෙන් ණය පැකේජය යටතේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොල සංවර්ධන ව්‍යාපෘතිය අදියර 2 (II) ක්‍රියාත්මක කිරීම උදෙසා ඇ.ඩො. මිලියන 375ක් සහ ජාතික විදුලිබල සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධනය යන කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය උදෙසා ඇ.ඩො. මිලියන 206ක් 2015 වසරේදී ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය මගින් ලබා ගැනීමට නියමිතය.

# 2014 වසරේ ජපාන ප්‍රදාන ආධාර

2014 වසරේ ජපාන සමස්ත ප්‍රදාන ආධාර එකඟතාවය, ජපාන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සෙසු රජයන් වෙත ප්‍රදානය කිරීම සඳහා වූ ව්‍යාපෘති නොවන ප්‍රදාන ආධාර (ඇ.ඩො. මිලියන 1.7) සහ උසස් තත්ත්වයේ ජපන් නිෂ්පාදන (වෛද්‍ය උපකරණ හා සුබසාධන උපකරණ) සම්පාදනය කිරීමේ ව්‍යාපෘති නොවන ප්‍රදාන ආධාර (ඇ.ඩො. මිලියන 4.8) වලින් සමන්විතය.


**44 වන යෙන් පැකේජය යටතේ ලබාදුන් ජපාන එකඟතාවය**

| ව්‍යාපෘතිය | ණය/ ප්‍රදාන | මුදල (ඇ.ඩො.මිලියන) | විස්තරය |
|---|---|---|---|
| කැළණි ගඟ හරහා නව පාලමක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | ණය | 342.0 | කොළඹ නගරය හා කටුනායක කොළඹ අධිවේගී මාර්ගය සම්බන්ධ කරමින් කැළණි ගඟ හරහා නව පාලමක් ඉදිකිරීම මගින් කොළඹ නගරය ආශ්‍රිතව ඇතිවන මාර්ග තදබදය අවම කරගත හැකිවේ. එමෙන්ම මෙමගින් කොළඹ වරායට හා අධිවේගී මාර්ග ජාලයට ප්‍රවේශවීමේ හැකියාව තවදුරටත් වර්ධනය කිරීමටද බලාපොරොත්තුවේ. |
| භෞමික රූපවාහිනී විකාශන කටයුතු ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය. -"රූ-සංඛ්‍යා" | ණය | 134.5 | රූපවාහිනී විකාශන ආයතන විසින් දරනු ලබන මෙහෙයුම් හා සම්ප්‍රේෂණ පිරිවැය අවම කිරීම, ප්‍රේක්ෂකයින් හට අනර්ඝ තත්ත්වයේ පින්තූර හා ශබ්ද මෙන්ම පුළුල් පරාසයක තේරීමට ලක් කළ හැකි නාලිකා සහ වැඩසටහන් නැරඹීමට අවකාශ සැලසීම හා රූපවාහිනී සංස්ථාවේ පහසුකම් වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කරනු ලැබේ. |

# 2014 වසරේ උපයෝජනය

2014 වසරේ සමස්ත උපයෝජනය ඇ.ඩො. මිලියන 239.9ක් වන අතර මින් ඉහළම උපයෝජනය වූ ඇ.ඩො. මිලියන 150.1ක් මාර්ග සංවර්ධන ක්ෂේත්‍රය හරහා වාර්තා විය.

2014 වසරේ සමස්ත උපයෝජනය




ඉහත සඳහන් කරන ලද ජපාන ආධාර ව්‍යාපෘති යටතේ 2014 වසරේ විදුලිබල හා බලශක්තිය උදෙසා ඇ.ඩො.මිලියන 36.4ක්ද, ජල සම්පාදනය උදෙසා ඇ.ඩො. මිලියන 33.2ක්ද, සෞඛ්‍යය ක්ෂේත්‍රය උදෙසා ඇ.ඩො. මිලියන 7.6ක්ද, දුගීබව තුරන් කිරීම හා පුනරුත්ථාපනය වැනි වෙනත් ක්ෂේත්‍රයන් උදෙසා ඇ.ඩො. මිලියන 12.6ක්ද උපයෝජනය කර ඇත.

2014 වසරේදී නිම කරන ලද ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | මුදල (ඇ.ඩො.මිලියන) |
|---|---|
| හදිසි ස්වාභාවික ආපදා පුනරුත්ථාපන ව්‍යාපෘතිය | 91.0 |
| ඉහළ කොත්මලේ ජල විදුලිබල ව්‍යාපෘතිය (11) | 40.0 |
| බලශක්ති විවිධාංගීකරණය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය | 7.0 |

2014 වසරේ ක්‍රියාත්මක ප්‍රධාන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | මුදල (ඇ.ඩො.මිලියන) |
|---|---|
| ණය | |
| මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය (අදියර I,2 සහ 2-I) | 743.5 |
| මහනුවර නගරයේ අපජලය කළමනාකරණ ව්‍යාපෘතිය | 152.4 |
| පළාත්/ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (මධ්‍යම, සබරගමුව හා නැගෙනහිර පළාත්) | 142.0 |
| ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතිය | 124.0 |
| ඉහළ කොත්මලේ ජල විදුලිබල ව්‍යාපෘතිය (II) | 300.0 |

| ව්‍යාපෘතිය | මුදල (ඇ.ඩො.මිලියන) |
|---|---|
| වවුනියා කිලිනොච්චි සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය ( I හා II) | 29.5 |
| ජල අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය (I හා II) | 190.8 |
| දිළිඳුකම පිටුදැකීම සඳහා වූ සුළු පරිමාණ ව්‍යාපෘතිය | 23.9 |
| බලශක්ති විවිධාංගීකරණය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය (ඉංජිනේරු සේවා) | 7.6 |
| නැගෙනහිර පළාත් ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය | 53.0 |
| හබරණ වේයන්ගොඩ සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය | 115.3 |
| පිබිදෙන කලාප ඉලක්ක කර ගත් මූලික සමාජ සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 47.4 |
| කුඩා හා සුළු කර්මාන්ත නායකත්ව හා ව්‍යවසායක ප්‍රවර්ධන ව්‍යාපෘතිය III | 93.0 |
| පරිසර හිතකාමී විසඳුම් අරමුදල් ව්‍යාපෘතිය II | 50.6 |
| මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ නාස්තිය අවම කිරීමේ ව්‍යාපෘතිය | 154.8 |
| ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 120.2 |
| නාය යෑම් ආපදා වලින් ජාතික මාර්ග ජාලය ආරක්ෂා කරගැනීමේ ව්‍යාපෘතිය | 74.0 |
| අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර I | 50.2 |
| කැළණි ගඟ හරහා නව පාලමක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 342.0 |
| භෞමික රූපවාහිනී විකාශන කටයුතු ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය | 134.5 |
| **ප්‍රදාන** | |
| කිලිනොච්චි ජල සම්පාදන යෝජනා ක්‍රමය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 8.3 |
| වෛද්‍ය උපකරණ සැපයීම වෙනුවෙන් වූ ව්‍යාපෘති නොවන ප්‍රදාන ආධාර | 11.0 |
| මඩකැණීමේ යන්ත්‍රයක් නිර්මානය කර සැපයීමේ ව්‍යාපෘතිය | 10.4 |
| කාර්මික උපකරණ සැපයීම | 3.7 |
| ජපාන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සෙසු රජයන් වෙත ප්‍රදානය කිරීම සඳහා වූ ව්‍යාපෘති නොවන ප්‍රදාන ආධාර | 2.1 |
| ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ගයන්හි ආරක්ෂිත ප්‍රවාහන පහසුකම් ස්ථාපිත කිරීම වෙනුවෙන් රථවාහන ගමනාගමන තොරතුරු පද්ධතියක් සැපයීමේ ව්‍යාපෘතිය | 9.9 |

## මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය

ජපන් රජය විසින් ශ්‍රී ලංකාවේ මාර්ග ජාලය වැඩිදියුණු කිරීම උදෙසා ජාතික මාර්ග හා අධිවේගී මාර්ග සංවර්ධනය කිරීමට විශාල දායකත්වයන් ලබා දී ඇත.

කොළඹ නගරය හා සම්බන්ධ අනෙකුත් ජාතික මහාමාර්ග හා සියලුම අධිවේගී මාර්ග එකිනෙකට සම්බන්ධ කරමින් ඉදිවන පිටත වටරවුම් මාර්ගය මංතීරු 6කින් සමන්විතවන අතර දිගින් කිලෝමීටර 29.1ක් වේ. මෙම ව්‍යාපෘතිය මඟින් කොළඹ නගරය ආශ්‍රිතව සීඝ්‍රයෙන් ඉහළ යනු ලබන රථවාහන තදබදය අවම කිරීම මෙන්ම අධික ජනගහනයකින් යුත් නාගරික ප්‍රදේශ බහුල බස්නාහිර පළාතින් බැහැරව රටේ අනෙක් ප්‍රදේශකරාද සංවර්ධනය ගෙනයමින් සමබර ආර්ථික වර්ධනයක් ඇති කිරීමද අපේක්ෂා කෙරේ.

කොට්ටාවේ සිට කඩුවෙල දක්වා කිලෝමීටර 12ක දිගින් යුත් මාර්ග කොටස ඇ.ඩො. මිලියන 186ක ජපන් මූල්‍යාධාර යටතේ මේ වන විට ඉදිකර අවසන් වී ඇති අතර මෙම ව්‍යාපෘතිය යටතේ පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ කඩුවෙල සිට කඩවත දක්වා වූ කිලෝමීටර 8.9ක දිගින් යුතු මාර්ග කොටස ඉදිකිරීම සිදුවේ. කඩුවෙල සිට කඩවත දක්වා වූ පිටත වටරවුම් අධිවේගී මාර්ගය ඉදිකිරීම මඟින් කොළඹ නගරය තුළ රථවාහන තදබදය අවම කිරීමද කොළඹ නගරය හා සම්බන්ධිත අනෙකුත් ජාතික මහාමාර්ග, දක්ෂිණ අධිවේගී මාර්ගය, නුවර-කොළඹ අධිවේගී මාර්ගය, කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය එකිනෙක සම්බන්ධ කිරීමටද බලාපොරොත්තුවේ. මීට අමතරව, මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මඟින් ඉහළම ප්‍රතිලාභ ලබා ගැනීම ඉලක්ක කර ගනිමින් මාකුඹුර (කොට්ටාව), කඩුවෙල හා කඩවත යන නගර තුන මාර්ග, ජලය හා විදුලිය යන යටිතල පහසුකම් සහිතව සංවර්ධනය කිරීමටද අපේක්ෂා කෙරේ.

## හබරණ-වේයන්ගොඩ විදුලි සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව බිඳවැටීම්වලින් තොර අඛණ්ඩ විදුලිබල සැපයුමක් ලබාදීම සහතික කරන හෙයින් එම ප්‍රදේශයන්හි සිටින ව්‍යාපාරික ප්‍රජාවට හා නිෂ්පාදකයින්ට සිය ආර්ථික කටයුතු වඩා ක්‍රමවත්ව හා සාර්ථක අයුරින් පවත්වාගෙන යාමේ අවස්ථාව උදාවේ. එමඟින් සෘජුවම මෙන්ම වක්‍රව රටේ ආර්ථික සංවර්ධනයට විශාල දායකත්වයක් ලැබෙනු ඇත.

නව හබරණ ස්වීච්පන්න අංගනයක් හා හබරණ ස්වීච්පන්න අංගනයේ සිට වේයන්ගොඩ ජාල උපපොළ දක්වා කිලෝවොට් 220ක විදුලි සම්ප්‍රේෂණ රැහැන් පද්ධතියක් ඉදිකිරීම සඳහා ජපාන රජය විසින් ඇ.ඩො. මිලියන 115ක මූල්‍යාධාර ලබා දී ඇත. මෙම ව්‍යාපෘතිය මඟින් ත්‍රිකුණාමල සාම්පූර් ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිත ගල්අඟුරු බලාගාරයෙන් උත්පාදනය වන විදුලිබලය ජාතික විදුලිබල ජාලයට සම්ප්‍රේෂණය කිරීමට හැකිවීම තුළින් රට තුළ ඉහළයනු ලබන විදුලිබල අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා උපකාරීවනු ඇත.

## කැළණි ගඟ හරහා නව පාලමක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය විවෘත වීමත් සමඟ දැනට පවතින කැළණි පාලම ආශ්‍රිතව රථවාහන තදබදය ඉහළ ගොස් ඇති අතර මෙයට පිළියමක් ලෙස ජපන් රජයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ මංතීරු 6කින් සමන්විත වන ලෙස නව කැළණි පාලම ඉදිකෙරේ. මේ මඟින් දැනට පවතින කැළණි පාලම ආශ්‍රිතව ඇතිවන රථවාහන තදබදය පාලනය කිරීම මෙන්ම කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය හා කොළඹ නගරයේ අනෙකුත් මාර්ග ජාල අතර සම්බන්ධතාවයන් වැඩිදියුණු කෙරේ.

## කළු ගඟ ජල සම්පාදන ව්‍යාපෘතිය

ජපාන යෙන් මිලියන 19,666 (දළ වශයෙන් රුපියල් මිලියන 25,369.14) ජපාන මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මකවන කළු ගඟ ජල සම්පාදන ව්‍යාපෘතිය මඟින් දිනකට ජලය ඝණමීටර 60,000ක් පවිත්‍ර කල හැකි ජල පවිත්‍රාගාරයක්, ජල සම්ප්‍රේෂණ නළ මාර්ග හා ජලය ඝණමීටර 120,000ක ධාරිතාවයකින් යුත් ජල ස්ථම්භයක් ඉදිකිරීම් සිදුවේ.

මෙම ව්‍යාපෘතිය මඟින් ජල කාන්දුව අවම කරමින් ජල බෙදාහැරීම වැඩිකිරීමට සැලසුම් කරන අතර දැනට පවතින ජල සම්පත තක්සේරු කිරීම හා ජලය සඳහා වන අනාගත ඉල්ලුම ඇස්තමේන්තුගත කිරීම යනාදියද ඇතුළත්ව, බස්නාහිර පළාතේ ජල අංශයේ ප්‍රධාන සැලැස්ම යාවත්කාලීන කිරීමද මේ යටතේ සිදු කෙරේ. ඉහත ව්‍යාපෘතිය බණ්ඩාරගම, පිළියන්දල, කැස්බෑව, ජබුරලිය යන දකුණු කොළඹ ප්‍රදේශ ආවරණය කරමින් ක්‍රියාත්මක වේ.

# කොරියාව

කොරියානු රජය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ද්වීපාර්ශ්වීය සංවර්ධන පාර්ශ්වකරුවෙකු ලෙස ශ්‍රී ලංකා රජයේ උපායමාර්ගික සංවර්ධන ප්‍රමුඛතා සඳහා තම දායකත්වය ලබාදේ. 1990 වර්ෂයේ සිට කොරියානු අපනයන හා ආනයන බැංකුව යටතේ ඇති ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල හරහා ණය ආධාර ලබා දී ඇති අතරම කොරියානු රජයේ ප්‍රදාන ආධාර කොරියානු අන්තර්ජාතික සහයෝගීතා ආයතන විසින් සපයනු ලබයි.

2008 වර්ෂයේ සිට කොරියානු රජය හා ශ්‍රී ලංකා රජය අතර අත්සන් කරනු ලැබූ කාර්යරාමු ගිවිසුම් මගින් නිශ්චිත කාලයක් තුළදී ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල යටතේ ලබාගත හැකි උපරිම ණය ප්‍රමාණය දැක්වේ. කාර්යරාමු එකඟතාවය පිළිවෙලින් 2008-2009, 2009-2012 සහ 2012-2015 කාල පරිච්ඡේද සඳහා ඇ.ඩො. මිලියන 140ක, ඇ.ඩො. මිලියන 200ක, ඇ.ඩො. මිලියන 290ක ණය ආධාර මෙරටට ලැබිණි.

**කොරියානු ණය ආධාර සඳහා මූල්‍ය නියමයන්**

| මූල්‍ය නියමයන් | සාමාන්‍ය මූල්‍ය නියමය | කොරියානු උපදේශකවරු සහභාගීවීම | පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය |
|---|---|---|---|
| පොලී අනුපාතිකය | 0.20% | 0.15% | පොලී රහිත |
| ආපසු ගෙවීම | වසර 30 | වසර 40 | |
| සහන කාලය | වසර 10 | | වසර 10 - 15 |
| ණය ප්‍රමාණය | සම්පූර්ණ ව්‍යාපෘති වියදම | | |
| මුදල් වර්ගය | කොරියානු වොන් | | |
| ශක්‍යතා අධ්‍යයනය | ප්‍රමුඛ ව්‍යාපෘති සඳහා ප්‍රදාන ලෙස | | |

2012-2015 අතර කාලය තුළ ශ්‍රී ලංකාවේ සංවර්ධන සැලසුම් කාර්යරාමුව අනුව ආර්ථික, සමාජයටිතල පහසුකම්, අධ්‍යාපන, තාක්ෂණ, වෘත්තීය අධ්‍යාපන, පුහුණු හා ද්වීතීයික අධ්‍යාපන සහ යහපාලනය යන ක්ෂේත්‍ර හඳුනාගත් ප්‍රමුඛතාවේ.

**ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල මගින් 2014 වර්ෂය තුළ අනුමත වී ඇති ව්‍යාපෘති**

| ව්‍යාපෘතිය | ණය මුදල (ඇ.ඩො.මිලියන) | අරමුණ |
|---|---|---|
| දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය | 58.1 | කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව හා පොල්පිතිගම ප්‍රදේශයන්හි ජනතාවට පානීය නල ජල පහසුකම් ලබාදීම |
| රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය | 20.5 | කෑගල්ල දිස්ත්‍රික්කයේ රුවන්වැල්ල ප්‍රදේශයේ ජනතාවට පානීය නල ජල පහසුකම් ලබාදීම |

# කොරියානු රජයේ ප්‍රදාන ආධාර

කොරියානු රජය මගින් ශ්‍රී ලංකාවට ලබාදෙන ප්‍රදානයන් කොරියානු අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය (KOICA) මගින් ලබාදෙන අතර එම ප්‍රදානයන් මගින් කුඩා පරිමාණ ව්‍යාපෘති මූල්‍යයනය, තාක්ෂණික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ස්වේච්ඡා සේවකයින් යෙදවීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කරයි. ප්‍රදාන ආධාර මගින් 2014 වසරේදී දොම්පේ ප්‍රදේශයේ සනීපාරක්ෂක කසල රඳවනය හා කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පාසල් ඉදිකිරීම සිදුකරන ලදි.

**2014 -2015 සඳහා අනුමත වී ඇති කොරියානු ප්‍රදානයන්**

| ව්‍යාපෘතිය | මුදල (ඇ.ඩො.මිලියන) |
|---|---|
| තාක්ෂණ ගුරු පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීම | 13.0 |
| කසල කළමනාකරණ ව්‍යාපෘතිය, කොට්කාවත්ත, මුල්ලේරියාව ප්‍රදේශය | 5.2 |
| ඩිජිටල් තාක්ෂණ අපරාධ විමර්ශන මධ්‍යස්ථානය ඉදිකිරීම | 3.2 |

# සනීපාරක්ෂක කසල රඳවනය ඉදිකිරීමේ ව්‍යාපෘතිය


මෙම ව්‍යාපෘතිය යටතේ පරිසර හිතකාමී ලෙස කසල බැහැර කිරීම සඳහා නව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදී ඇත. මේ මගින් දිනකට මෙට්‍රික් ටොන් 10ක කසළ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අතරම ධාරිතාවය මෙට්‍රික් ටොන් 20,000ක පමණ වන අතර එය වසර 10-15ක් දක්වා කාලපරාසයක් සඳහා භාවිතා කළ හැක.

මෙම ව්‍යාපෘතිය සඳහා කොරියානු අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය මගින් ඇ.ඩො. මිලියන 4.5ක ප්‍රදාන ආධාර ලබාදී ඇති අතර ශ්‍රී ලංකා රජය මගින් ඇ.ඩො. මිලියන 1.5ක්ද ලබාදී ඇත. සනීපාරක්ෂක කසල රඳවන ක්‍රමය මෙරට ක්‍රියාත්මක වූ මුල්ම අවස්ථාව ලෙස මෙම ව්‍යාපෘතිය සැලකිය හැක.

2014 වසරේදී ඉඩම් සැකසීම, පවිත්‍රාගාරයේ සහ නඩත්තු ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු අවසන් කරන ලද අතර මෙහෙයුම් කටයුතු 2015 වර්ෂයේ මුල් භාගයේදී ආරම්භ කිරීමට නියමිතය.

# 2014 වර්ෂයේ කොරියානු එකඟතා


**කොරියානු ණය සහ ප්‍රදාන ආධාර එකඟතා 2005 -2014 (ඇ.ඩො. මිලියන)**



පසුගිය දස වසරක කාලය හා සැසඳීමේදී 2013, 2014 වර්ෂවලදී ඇ.ඩො. මිලියන 59.5ක සහ ඇ.ඩො. මිලියන 78.6ක කොරියානු ණය ආධාර ප්‍රමාණ මෙරටට ලබාගත හැකිවීම ඉහළ ප්‍රගතියක් ලෙස සැලකිය හැකිය. ඒ අනුව දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ණය ආධාර ලෙස ඇ.ඩො. මිලියන 58.2ක්ද රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ණය ආධාර ලෙස ඇ.ඩො. මිලියන 20.5ක්ද ලැබූ අතර ඊට අදාළ ගිවිසුම් 2014 වර්ෂයේ දෙසැම්බර් මස ශ්‍රී ලංකා හා කොරියානු රජය අතර අත්සන් කරනු ලැබීය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මගින් කුරුණෑගල හා කෑගල්ල දිස්ත්‍රික්කවල ජනතාවට පිරිසිදු පානීය නල ජලය ලබාදීමට හැකිවේ.

## 2014 කොරියානු උපයෝජනය

2014 වර්ෂයේ දී ක්ෂේත්‍ර සඳහා උපයෝජන





කොරියානු මූල්‍යාධාර යටතේ 2014 වසර සඳහා මුළු උපයෝජනය ඇ.ඩො. මිලියන 20.2ක් වන අතර එයින් සියයට 66ක ප්‍රතිශතයක් මාර්ග හා පාලම් ක්ෂේත්‍රය සඳහා වෙන්වී ඇත.

## දැදුරු ඔය සහ රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය මගින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව සහ පොල්පිතිගම ප්‍රදේශයන්හි ජීවත් වන ජනතාවට පානීය නල ජල පහසුකම් සැපයේ. මෙම ව්‍යාපෘතිය මගින් දිනපතා ජල ඝණමීටර 15,000ක් පිරිසිදු කිරීමට හැකියාව ඇති ජල පවිත්‍රාගාරයක්, ඝණ මීටර 750ක, ඝණ මීටර 1,000ක සහ ඝණ මීටර 1,500ක ධාරිතාවයකින් යුත් ජල ස්ථම්භ හා කිලෝමීටර 266ක දිගැති ජල බෙදාහැරීමේ ජාලයක් ඉදිකෙරේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මගින් මහව හා පොල්පිතිගම ප්‍රදේශවල ජනතාවගේ පානීය ජල ගැටළුවට විසඳුම් ලැබෙන අතරම ජලය මගින් ලෙඩ රෝග බෝවීම පාලනය වේ.

කෑගල්ල දිස්ත්‍රික්කයේ රුවන්වැල්ල නගරයෙහි ප්‍රධාන ජල මූලාශ්‍රය වන ළිං වියළි කාලයේදී සිඳීයාමෙන් ප්‍රදේශයේ ජනතාව උග්‍ර ජල හිඟයකින් පීඩා විඳිති. විශේෂයෙන්ම කඳුකර ප්‍රදේශයන්හි ජීවත් වන ජනතාවට වියළි කාලයේදී ජලය සපයා ගැනීමේ දැඩි දුෂ්කරතාවයක් ඇතිවේ. රුවන්වැල්ල ජල යෝජනා ක්‍රමය මගින් මෙම ප්‍රදේශයට නල ජල පහසුකම් ලබාදීමට නියමිත අතර එමගින් පවතින ජල ගැටලුවට විසඳුමක් ලබාදෙන අතරම ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමටද හැකියාව ලැබේ.

ඉහත අරමුණ සාක්ෂාත් කරගැනීම උදෙසා කොරියානු ආනයන-අපනයන බැංකුවේ ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල මඟින් පිළිවෙලින් ඇ.ඩො. 58,155,000 සහ ඇ.ඩො. 20,530,000ක ණය ආධාර දැදුරු ඔය ජල සම්පාදන යෝජනා ක්‍රමය හා රුවන්වැල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් ලබාදීමට එකඟ වී ඇත. මීට අදාල ණය ගිවිසුම් 2014 දෙසැම්බර් මස 30 වෙනි දින අත්සන් කරන ලද අතරම ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ක්‍රියාවට නංවයි.



# ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් අංශය

## ලෝක බැංකු සමූහය සමඟ සංවර්ධන සබැඳියාව

ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම් ලබන රටක තත්ත්වයට පත්වීමත් සමග ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා ලෝක බැංකු හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අරමුදල් ඒකරාශි කිරීම හා කළමනාකරණය කිරීමට පහසුකම් සැලසීම මෙම අංශයේ වගකීම වේ.

---

සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා ලෝක බැංකු අරමුදල් යොදා ගැනීම අතින් දිගුකාලීන සබැඳියාවක් ශ්‍රී ලංකාව හා ලෝක බැංකුව අතර පවතී. මෙකී අරමුදල් ණය හෝ ප්‍රදාන ලෙස ලබාදෙන අතර, ඒවා ලබාදීමේ යාන්ත්‍රණය ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය (IDA) සහ ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා අන්තර්ජාතික බැංකුව (IBRD) හරහා සිදු කෙරෙන අතර, අරමුදල් සම්පාදනය කරන ක්‍රමවේදය ක්‍රියාත්මක වන්නේ ශ්‍රී ලංකාවටම අනොන්‍ය "දේශීය සහභාගීත්ව උපාය මාර්ග" නම් වූ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවකට අනුකූලවය. 2013 ජූලි සිට 2016 ජූනි කාලසීමාව දක්වා මෙම සංවර්ධන ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක වෙමින් පවතී. වර්තමාන දේශීය සහයෝගීත්ව උපායමාර්ග යටතේ සක්‍රීය ආයෝජන ප්‍රමාණය ඇ.ඩො. මිලියන 1931.1ක් වේ.

IBRD බැංකුවේ අරමුදල් ලබා ගැනීමේදී සහනදායී හා සහනදායී නොවන යන දෙයාකාරයෙන්ම සම්මිශ්‍රණය වූ කොන්දේසිවලට අනුව ණය ලබාගැනීමට සිදුවන මුත්, 2014 වසරේදී සහනදායී ණය ලබාදෙන IDA ආයතනයෙන් ණය හෝ ප්‍රදාන ලෙස අරමුදල් ලබාගැනීමට රජය විසින් හැකි සෑම පරිශ්‍රමයක්ම දැරීය.

**2014 වසරේ ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති**

| වැඩසටහන/ ව්‍යාපෘතිය | මුදල (ඇ.ඩො.මිලියන) |
|---|---|
| නිපුණතා සංවර්ධන වැඩසටහන | 99.7 |
| වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණය | 148.8 |
| උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය | 144.4 |
| හදිසි දේශගුණික ආපදා සඳහා වන විශේෂ ණය වැඩසටහන | 102.0 |
| දේශගුණික අවබලපෑම් අවම කිරීමේ වැඩසටහන | 110.9 |
| ආපදා අවදානම් කළමනාකරණ ව්‍යාපෘතිය | 0.4 |
| අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන | 128.3 |
| උතුරු නැගෙනහිර පළාත් පාලන සේවාවන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 70.8 |
| සෞඛ්‍ය අංශයේ සංවර්ධන වැඩසටහන | 196.0 |
| දිරි සවිය ව්‍යාපෘතිය | 0.9 |
| කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | 213.9 |
| ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ ව්‍යාපෘතිය | 6.5 |
| මළාපවාහන සේවාව සඳහා ගෘහස්ථ ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීම | 5.1 |
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හැකියාව නැංවීමේ ව්‍යාපෘතිය | 0.5 |
| උතුරු පළාතේ ප්‍රාදේශීය මට්ටමේ පෝෂණ තත්ත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 2.7 |
| මාර්ග අංශ සහාය ව්‍යාපෘතිය | 298.1 |

| වැඩසටහන/ ව්‍යාපෘතිය | මුදල (ඇ.ඩො. මිලියන) |
|---|---|
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතිය | 57.4 |
| පළාත්බද මාර්ග ව්‍යාපෘතිය | 105.0 |
| විසිඑක්වන ශත වර්ෂය සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය | 40.0 |
| ගමනැගුම ව්‍යාපෘතිය | 75.0 |
| යලි පුබුදමු ව්‍යාපෘතිය | 124.7 |
| **එකතුව** | **1931.1** |

# එකඟතාවයන්

ණය හා ප්‍රදාන වශයෙන් ලෝක බැංකුවෙන් ඇ.ඩො. මිලියන 570ක මූල්‍ය ප්‍රමාණයක් ලබා ගැනීමට ශ්‍රී ලංකාවට 2014 වර්ෂයේදී හැකිවිය. රටේ මැදි ආදායම් අවශ්‍යතා හා ජීවන තත්ත්වය වඩා උසස් තත්ත්වයකට පත් කිරීමේ අරමුණින් නාගරික සංවර්ධනය සඳහා ඇ.ඩො. මිලියන 147ක්ද දේශගුණික විපර්යාසයන් හේතුවෙන් ජන සමාජයට ඇතිවන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා ඇ.ඩො. මිලියන 295.5ක්ද, ලබා දීම 2014 වසරේ ලෝක බැංකුවේ ප්‍රමුඛම ආයෝජනයන් වේ. මෙවැනි ක්ෂේත්‍රයන්හි වැඩි ආයෝජනයක් මඟින් පිළිඹිමුවන්නේ දේශගුණික මූල්‍යයනය හා නාගරික සංවර්ධනය වැනි ප්‍රතිලාභ ලැබීමට කාලයක් ගතවන ආයෝජන ක්ෂේත්‍ර සඳහා ලෝක බැංකුව වැනි සහනදායී මූල්‍ය ප්‍රභවවලින් ණය ලබාගැනීම රජයේ අරමුණයි.

**2014 වර්ෂයේ ලෝක බැංකුව හා ගිවිසගත් ණය හා ප්‍රදාන**


| ව්‍යාපෘතිය | ණය / ප්‍රදාන ප්‍රමාණය (ඇ.ඩො. මිලියන) | අරමුණ |
|---|---|---|
| අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන-වැඩිමනක් ප්‍රදාන | 16.3 ප්‍රදාන | මෙම ප්‍රදාන අරමුදල් යොදා ගැනෙනුයේ වසර 2012දී ඇ.ඩො. මිලියන 100ක පිරිවැයකින් ආරම්භ කරන ලද මෙම වැඩසටහනේ ඉදිරි උන්නතිය උදෙසාය |
| උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය | 144.4 ණය | මහනුවර හා ගාල්ල නගරබද ප්‍රදේශ දියුණු කිරීම මෙහි අරමුණයි. මෙමඟින් ලෝක උරුම නගරයක් වන මහනුවර නගරයේ වාහන තදබදය ඉවත් කිරීම හා තත්ත්වයෙන් උසස් වූ නාගරික සේවාවක් සැපයීම මෙන්ම ගාල්ල නගරයේ ජලගැලීම් අඩුකිරීම හා නාගරික ප්‍රදේශවල පොදු ස්ථාන දියුණු කිරීම සිදු කෙරේ |
| ජලවේලි ආරක්ෂණය හා ජල සම්පත් සැලසුම්කරණය සඳහා අතිරේක මූල්‍යයනය | 81.5 ණය | මුල් ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභී ප්‍රදේශ නොවූ උතුරු හා නැගෙනහිර පළාත්වලත් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අතිරේක මූල්‍යයන යොදා ගැනේ |

| ව්‍යාපෘතිය | ණය / ප්‍රදාන ප්‍රමාණය (ඇ.ඩො. මිලියන) | අරමුණ |
|---|---|---|
| දේශගුණික අවබලපෑම් අවම කිරීමේ වැඩසටහන | 110.9 ණය | (i). දේශගුණික විපර්යාසයන් නිසා හානියට පත්වන දේපළ හා ජන ජීවිතය නැවත යථා තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය ක්ෂණික මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට "හදිසි ආපදා සඳහා වන විශේෂ ණය වැඩසටහන" යටතේ ඇ.ඩො. මිලියන 102ක් උපයෝගී කරගනු ඇත.<br>(ii). දේශගුණික විපර්යාසයන් නිසා හානියට පත්වේ යයි උපකල්පනය කරනු ලබන භෞතික යටිතල පහසුකම්වල ඔරොත්තුදීමේ හැකියාව වැඩිදියුණු කිරීමේ අරමුණින් වාරි මාර්ග අංශයේ යටිතල පහසුකම් සංවර්ධනයට "දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඇ.ඩො. මිලියන 110ක් උපයෝගී කරගනු ඇත. |
| හදිසි ආපදා සඳහා වන විශේෂ ණය වැඩසටහන | 102.0 ණය | |
| නිපුණතා සංවර්ධන වැඩසටහන | 99.7 ණය | දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළේ ඉල්ලුමට අනුව, වර්ෂ 2020 වන විට කාර්යක්ෂම නිපුණතා සංවර්ධන පද්ධතියක් ගොඩනැගීම සඳහා උපාය මාර්ගික සැලසුමක් ක්‍රියාත්මක කිරීම. |
| උතුරු නැගෙනහිර පළාත් පාලන සේවාවන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා වූ අතිරේක මූල්‍යයනය | 20.3 ප්‍රදාන | පළාත් පාලන ආයතන මඟින් වඩා හොඳ සේවාවක් ලබාදීම සඳහා උතුරු නැගෙනහිර පළාත් සඳහා ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය ඌව, මධ්‍යම හා වයඹ පළාත්වලද දියත් කිරීම. |
| අපදා අවදානම් කළමනාකරණ ව්‍යාපෘතිය | 0.4 ප්‍රදාන | නැගෙනහිර පළාතේ නගර සභා 10ක් සඳහා අවදානම් තක්සේරු ක්‍රියාදාමයක් සිදු කිරීම, ආපදා කළමනාකරණය සඳහා වූ ආයතනවල තාක්ෂණික ධාරිතාව වර්ධනය කිරීම හා මධ්‍ය කඳුකරයේ නායයාම් අවදානම් කළමනාකරණය මෙමඟින් සිදු කරනු ඇත. |

# උපයෝජන

වර්තමාන ලෝක බැංකු ආයෝජන යටතේ 2014 වසර සඳහා උපයෝජන ප්‍රමාණය ඇ.ඩො. මිලියන 195.6ක් වේ. ඉන් වැඩිම උපයෝජන ප්‍රමාණය වූ ඇ.ඩො. මිලියන 52.4 (සියයට 27) මාර්ග හා ප්‍රවාහන අංශය සඳහා විය. දෙවනුවට වැඩිම උපයෝජන ප්‍රමාණයක් කරන ලද්දේ ප්‍රාදේශීය සංවර්ධනය වෙනුවෙනි. ඒ ඇ.ඩො. මිලියන 42.3 (සියයට 22)කි. තවද සෞඛ්‍යය, වාරිමාර්ග හා අධ්‍යාපන අංශ සඳහා පිළිවෙළින් ඇ.ඩො. මිලියන 26.8 (සියයට 14), 26.5 (සියයට 13) හා 24.4 (සියයට 12) උපයෝජනය කරන ලදි.

**2014 වසරේ උපයෝජනයන්හි ආංශීය ව්‍යාප්තිය**




# 2014 වසරේ විශේෂ කරුණු

ස්වාභාවික ආපදාවකට පසු හදිසි ආපදා තත්ත්වයක් රජය විසින් ප්‍රකාශ කළ අවස්ථාවක, කොටසක් හෝ සම්පූර්ණයෙන්ම ක්ෂණිකව අරමුදල් ලබා ගත හැකි නව මූල්‍ය පහසුකමක් ලෙස "හදිසි දේශගුණික ආපදා සඳහා වන විශේෂ ණය වැඩසටහන" යටතේ ඇ.ඩො. මිලියන 102ක මුදලක් ශ්‍රී ලංකාවට ලබා ගැනීමට හැකිවිය. මෙම ණය පහසුකම දකුණු ආසියාවේ මුල්ම වරට ලබාගත් රට වන්නේ ශ්‍රී ලංකාවයි. දැනට උපයෝජනය කර නොමැති මෙම ණය පහසුකම අවශ්‍ය විටෙක ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව වෙනුවෙන් වෙන් කර ඇත.

# ඉදිරි පියවරයන්

පහත දැක්වෙන ව්‍යාපෘති 2015 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමේ අරමුණින් රජය හා ලෝක බැංකුව අතර සාකච්ඡා පවත්වන ලදි.

**2015 වසර සඳහා යෝජිත ව්‍යාපෘති**

| ව්‍යාපෘතිය | ප්‍රමාණය (ඇ.ඩො. මිලියන) | ප්‍රභවය |
|---|---|---|
| ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 100 | IDA |
| පූර්ව ළමාවිය සංවර්ධන වැඩසටහන | 50 | IDA |
| මාර්ග සම්බන්ධීකරණ ව්‍යාපෘතිය | 125 | IBRD/ IDA |
| උතුරු නැගෙනහිර පළාත් පාලන සේවාවන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | 20 | IDA |

# මැද පෙරදිග හා දකුණු ආසියානු රටවල් අංශය

## මැද පෙරදිග රටවල්

ශ්‍රී ලංකාවේ සමාජයීය හා ආර්ථික සංවර්ධනය කෙරෙහි මැද පෙරදිග සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් කැපී පෙනෙන මෙහෙයක් සිදු කර ඇත. 1970 දශකයේ සිට මේ දක්වා, ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රමුඛතාවයන් ඉලක්ක කරගනිමින් මෙම පාර්ශ්වකරුවන් ඇ.ඩො. මිලියන 1,177ක් පමණ ලබා දී ඇති අතර, වසර 2005න් පසු අඛණ්ඩව වාරිමාර්ග, මාර්ග හා පාලම්, බලශක්ති හා සෞඛ්‍යය ක්ෂේත්‍රයන්හි සංවර්ධනය උදෙසා දායකත්වය දක්වා තිබේ.

මෙම ණය පහසුකම්වලට අදාල සහනදායී මෙන්ම නම්‍යශීලී ණය කොන්දේසි හා පොලී අනුපාතික මෙන්ම දීර්ඝ නැවත පියවීමේ කාලයන් ශ්‍රී ලංකාව වෙත වඩා වාසිදායක වේ.

### මැද පෙරදිග සංවර්ධන පාර්ශ්වකරුවන්

මැද පෙරදිග සංවර්ධන පාර්ශ්වකරුවන් වන සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල, අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල, අරාබි ආර්ථික සංවර්ධනය සදහා වන කුවේට් අරමුදල සහ ඉස්ලාමීය ඉරාන ජනරජය ශ්‍රී ලංකාව වෙත ඔවුනට ආවේනික ආයතනික ප්‍රමුඛතාවයන් පෙරදැරි කරගනිමින් මූල්‍යමය සහයෝගීතාව ලබාදෙන අතර විශේෂයෙන් සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල සහ අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල දිළිඳු බව තුරන් කිරීම සඳහා ද අවධානය යොමු කර තිබේ. මීට අමතරව මැද පෙරදිග රටවල් සමඟ ද්විපාර්ශ්වීය සබඳතා වර්ධනය කර ගැනීමේ අරමුණින් ඊශ්‍රායලය හා අබුඩාබි යන රටවල ආයතන සමඟ මූලික සාකච්ජා ආරම්භ කර ඇත.

## සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල

මෙම අරමුදල 1974 දී සංවර්ධනය වන රටවල ආර්ථිකයන් වැඩි දියුණු කිරීමේ අරමුණින් පිහිටුවා ඇත. මෙහි මූලික අරමුණ වන්නේ විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා දායකත්වය දැක්වීම මෙන්ම සෞදි අරාබියානු පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන මිලදී ගැනීම සඳහා හා අපනයන රක්ෂණ පහසුකම් සැපයීම මගින් ඒවා ප්‍රවර්ධනය කිරීමයි.

වාරිමාර්ග, මහාමාර්ග හා සෞඛ්‍ය ක්ෂේත්‍රයන් වෙත මෙම ආයතනය විසින් මූල්‍ය පහසුකම් සම්පාදනය කර ඇති අතර දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා ලබා දීමට එකඟ වී ඇති මුළු අරමුදල් ප්‍රමාණය ඇ.ඩො. මිලියන 123කි.

මීට අමතරව ඇ.ඩො. මිලියන 180ක පමණ වටිනාකමකින් යුත් අරමුදල් සංවර්ධන ව්‍යාපෘති 5ක් සඳහා ලබා දිමට මූලික සාකච්ජා සිදු කෙරෙන අතර මෙම වසරේදී එම ව්‍යාපෘති ආරම්භ වීමට නියමිත වී තිබේ.

# සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල

වසර 1976 සිට ශ්‍රී ලංකාවේ වේගවත් සංවර්ධන ක්‍රියාදාමයට දායකත්වය දැක්වූ මෙම අරමුදල විශේෂයෙන් මහාමාර්ග, වාරිමාර්ග, බලශක්ති යන ක්ෂේත්‍ර කෙරෙහි සිය දායකත්වය ලබා දී ඇත.

මෙම අරමුදල මගින් ව්‍යාපෘති ණය, වැඩසටහන් ණය, ගෙවුම් ශේෂය පියවීමේ ණය වැනි විවිධ ණය පහසුකම් රාජ්‍ය අංශය වෙත ලබාදෙන අතර, ශ්‍රී ලංකාව වෙත ඇ.ඩො. මිලියන 187ක් ලබා දී ඇත. මෙම මුදලින් ඇ.ඩො. මිලියන 107ක් හෙවත් සියයට 57ක් ලබාදී ඇත්තේ මහාමාර්ග අංශය සඳහා ය.

මීට අමතරව ඇ.ඩො. මිලියන 55ක් ජාතික සංවර්ධන බැංකුව, LOLC ක්ෂුද්‍ර මූල්‍ය සමාගම, ලංකා ඔරික්ස් ලීසිං සමාගම යන ආයතන සඳහා ''ආයෝජන ධෛර්යමත් කිරීමේ හා ආරක්ෂා කිරීමේ'' ගිවිසුම යටතේ ලබා දී ඇත.

# අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල

ශ්‍රී ලංකාව අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල සමග වර්ෂ 1976 දී ප්‍රථම ද්විපාර්ශ්වීය ගිවිසුමට එළඹෙන ලදි. ඒ අනුව මේ දක්වා අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල ඇ.ඩො. මිලියන 195.5ක මුදලක් ලබා දී ඇති අතර මේ අතරින් සියයට 95ක් වාරිමාර්ග ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා ලබා දී ඇත. මේ අතර කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය හා මහවැලි C - කලාපය සංවර්ධන ව්‍යාපෘතිය කැපී පෙනේ.

2014 වසරේ අත්සන් තබන ලද පාලම් 25ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වූ මූල්‍ය ගිවිසුම හා මෙම අරමුදල අතර සබඳතා තවදුරත් ශක්තිමත් වන ලදි.

## එකඟතා සහ උපයෝජනය

අරාබි සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල ජාතික මාර්ග පද්ධතියේ පාලම් 25ක් සංවර්ධනය කිරීම සඳහා ඇ.ඩො. මිලියන 35ක ණය පහසුකමක් 2014 වර්ෂයේදී ලබා දෙන ලදි. මීට අමතරව සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල තට්ටුතුරෙයි පාලම ඉදිකිරීම සඳහා මඩකලපුව-ත්‍රිකුණාමලය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ උපයෝජනය නොවූ ඉතිරි මුදල් ලබාදීමට එකඟතාවය පළකර ඇත.


මීට අමතරව යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ රජයේ වැඩපිළිවෙලට ඉහළ දායකත්වයක් ලබාදෙනු පිණිස අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල විසින් ඇ.ඩො. මිලියන 17ක් බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ද ඇ.ඩො. මිලියන 60ක් බදුල්ල-චෙන්කලාඩි A 5 මාර්ගය පුනරුත්ථාපනය සඳහා ද ලබා දීමට එකඟ වී ඇත. ඇ.ඩො. මිලියන 77ක වටිනාකමින් යුත් මෙම ණය ගිවිසුම් 2015 වසර තුළදී අත්සන් කිරීමට අපේක්ෂිත ය.

## කාර්යක්ෂම ප්‍රවාහන පහසුකම් තුළින් ප්‍රාදේශීය සංවර්ධනය කරා

ආර්ථික හා වාණිජ සංවර්ධනය, ප්‍රාදේශීය ඒකාබද්ධතාව හා රැකියා උත්පාදනය සඳහා කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක පූර්ව අවශ්‍යතාව සලකා බලමින් රජය විසින් ජාතික මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම කාලීන අවශ්‍යතාවක් ලෙස හඳුනාගෙන ඇත. මෙම අරමුණ සඳහා දායකත්වය දක්වමින් ජාතික මාර්ග පද්ධතියේ පටු සහ පැරණි පාලම් පුළුල් කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල විසින් ඇ.ඩො. මිලියන 16ක ණය පහසුකම් ලබා දී ඇත. මේ මගින් පාලම් 65ක් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු යොදා ඇති අතර ඉන් 37ක් මේ වන විටද වැඩ අවසන් කර තිබේ. තවද 2014 වසරේදී එම අරමුදල මගින් පාලම් 25ක ප්‍රතිසංස්කරණය කටයුතු සඳහා ඇ.ඩො. මිලියන 37ක මුදලක් ලබා දීමට රජය සමඟ ගිවිසුම් අත්සන් කරන ලදි. මේ මගින් සබරගමුව පළාත තුළ පාලම් 9ක්, බස්නාහිර හා වයඹ පළාත්වල පාලම් 5 බැගින්, දකුණ හා උතුරු පළාත්වල පාලම් 2 බැගින් හා නැගෙනහිර හා මධ්‍යම පළාත්වල පාලම් 1 බැගින් ඉදිවනු ඇත.



**බදුල්ල-චෙන්කලාඩි A 5 මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය.**




පේරාදෙණිය-බදුල්ල-චෙන්කලාඩි මාර්ගය මධ්‍යම හා නැගෙනහිර පළාත්, ඌව පළාත් හරහා සම්බන්ධ කරන එබැවින්ම සංචාරක ආකර්ෂණය දිනාගත් මහාමාර්ගයක් ලෙස හඳුනාගෙන ඇත. මෙම මාර්ගයේ පේරාදෙණිය සිට බදුල්ල දක්වා කොටස පුනරුත්ථාපනය කිරීමේ කටයුතු මේ වන විටද ආරම්භ වී ඇති අතර බදුල්ල සිට චෙන්කලාඩි දක්වා කිලෝමීටර 151.1ක කොටස පුනරුත්ථාපනය කිරීම සඳහා මැද පෙරදිග සංවර්ධන පාර්ශ්වකරුවන් එකඟ වී ඇත. ඒ අනුව ඇ.ඩො. මිලියන 140ක පිරිවැයක් දරන මෙම ව්‍යාපෘතිය සඳහා වන සෞදි අරමුදල ඇ.ඩො. මිලියන 60ක් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදලින් ඇ.ඩො. මිලියන 60ක් සහ ශ්‍රී ලංකා රජය විසින් ඇ.ඩො. මිලියන 20ක් ලබා දෙනු ඇත.

**මැද පෙරදිග සංවර්ධන පාර්ශ්වකරුවන් ලබා දෙන ලද ප්‍රදාන**

2014 වර්ෂයේ දී මැද පෙරදිග සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් මන්නාරම, මුලතිවු හා වව්නියා දිස්ත්‍රික්කවල දීර්ඝ කාලයක සිට අවතැන් වූ ජනතාව වෙත නිවාස ලබාදීමේ ව්‍යාපෘති සඳහා පහත සඳහන් ප්‍රදාන ලබා දී ඇත.


බහරේන් රජය
ඇ.ඩො. මිලියන 1.1


කසකස්ථාන රජය
ඇ.ඩො. මිලියන 0.2


ඕමන් රජය
ඇ.ඩො. මිලියන 1.0

**සම්මුති සාකච්ඡා පවත්වමින් පවතින ව්‍යාපෘති**

1
- බදුල්ල-චෙන්කලඩි මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය
- විදේශ ආධාර ඇ.ඩො. මිලියන 60
- SFD සහ OFID සම මූල්‍ය දායකත්වය

2
- කුරුණෑගල සහ ගම්පහ දිස්ත්‍රික්කවල කිරි නිෂ්පාදන හා අපනයන කෘෂිකාර්මික ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීම හරහා ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය.
- විදේශ ආධාර ඇ.ඩො. මිලියන 25

3
- වයඹ විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතිය.
- විදේශ ආධාර ඇ.ඩො. මිලියන 30


4
- මහවැලි වම් ඉවුර පහල නිම්න සංවර්ධන ව්‍යාපෘතිය (කන්තලේ සහ කින්නියා)
- විදේශ ආධාර ඇ.ඩො. මිලියන 60

5
- පොලොන්නරුව නැගෙනහිර නාගරික ජල සම්පාදන ව්‍යාපෘතිය
- විදේශ ආධාර ඇ.ඩො. මිලියන 420


# උපයෝජනය

2014 වසර තුළ වාර්ෂික උපයෝජනය ඇ.ඩො. මිලියන 27.45කි. මෙම මුදලින් සියයට 78.91ක් මහාමාර්ග ආංශික සංවර්ධනය සඳහා ලැබී ඇත.

**ආංශික උපයෝජනය (ඇ.ඩො. මිලියන)**



**උපයෝජනය (ඇ.ඩො. මිලියන)**




## විශේෂ වැඩසටහන්

ඉරාක ජනරජයේ ඉල්ලීමකට අනුව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මගින් අයවැය සම්පාදනය පිළිබඳ ශ්‍රී ලාංකේය අත්දැකීම් හුවමාරු කර ගැනීමේ වැඩමුළුවක් 2014 වසරේ සැප්තැම්බර් මසදී පවත්වන ලදි. ඉරාක දූත පිරිස ගරු ඉරාක ජනරජයේ කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍ය ආචාර්ය සාසි රාධි රේබාන් මැතිතුමාගේ මූලිකත්වයෙන් සහභාගී වූ අතර ඊට ඉරාක රජයේ ආයතන ප්‍රධානීන්ගෙන් සමන්විත නිලධාරී පිරිසක් අන්තර්ගත විය. ශ්‍රී ලංකා පාර්ශ්වයෙන් මෙම වැඩමුළුවේ සම්පත්දායකයින් ලෙස මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් අගනා දායකත්වයක් ලබා දෙන ලදි.

# දකුණු ආසියාව

## ඉන්දියාව


ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර සංවර්ධන සහයෝගීතාවයට දශක හතරකට අධික ඉතිහාසයක් තිබේ. වර්ෂ 2008න් පසුව ආර්ථික සංවර්ධනය සඳහා ඉන්දියානු සහාය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබෙන අතර මෙම කාලපරිච්ඡේදය තුළ එය ඇ.ඩො. මිලියන 1,576ක් වේ. මෙයින් ඇ.ඩො. මිලියන 1,250ක් ණය ආධාර ලෙස ලබා දී ඇති අතර ඇ.ඩො. මිලියන 326ක් ලබාදී ඇත්තේ ප්‍රදාන ලෙසය.

ඉන්දියානු ආනයන අපනයන බැංකුව විසින් ණය ආධාර ලබාදෙන අතර විශේෂ සංවර්ධන ව්‍යාපෘති සහ කුඩා සංවර්ධන ව්‍යාපෘති යන යෝජනා ක්‍රම යටතේ ඉන්දියානු රජය විසින් ප්‍රදානයන් ලබාදෙනු ලබයි. වර්තමානයේ දී ආර්ථික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ජීවනෝපාය සංවර්ධනය, අධ්‍යාපනය, සෞඛ්‍යාරක්ෂණ පහසුකම් ඉහළ නැංවීම, ශක්‍යතාවයන් ගොඩනැංවීම සහ ආර්ථික නව්‍යකරණය ආදිය ඉලක්ක කරගනිමින් ඉන්දියානු සංවර්ධන සහාය මෙරටට ගලා එයි.

## 2014 දී ඇතිකරගත් එකඟතාවයන්

ඉන්දියානු රජය විසින් යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයෙහි සහ ඉංජිනේරු පීඨයෙහි පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 600ක් ප්‍රදානය කිරීමට එකඟත්වය පළකරන ලදි. ඒ අනුව මේ සඳහා වන අවබෝධතා ගිවිසුම 2014 වසරේ ජුනි මස දී අත්සන් තැබිණි.

**2008 - 2014 දක්වා ආංශික එකඟතාවයන් (ඇ.ඩො. මිලියන)**





# 2014 දී උපයෝජනයන්

වර්ෂ 2014 දී වාර්තාගත මුළු උපයෝජනය ඇ.ඩො. මිලියන 142.86ක් වන අතර මෙයින් ඇ.ඩො. මිලියන 106.14ක් ප්‍රධාන වශයෙන් ඕමන්ත සිට පලෙයි දක්වා, මැදවච්චිය සිට මඩුපාර දක්වා, මඩුපාර සිට තලෙයිමන්නාරම දක්වා, පලෙයි සිට කන්කසන්තුරේ දක්වා දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමටත්, උතුරු දුම්රිය මාර්ගයේ සංඥා සහ විදුලි සංදේශන පහසුකම් නැංවීමටත්, දඹුල්ල තදාසන්න ජල සම්පාදන ව්‍යාපෘතිය සහ ආරක්ෂක අමාත්‍යාංශය වෙත ලබාගත් ණය ආධාර ආදිය වෙතින් වාර්තා විය.

තවත් ඇ.ඩො. මිලියන 24.20ක් උතුරු, නැගෙනහිර, ඌව සහ මධ්‍යම පළාත් තුළ ක්‍රියාත්මක නිවාස 49,000ක ප්‍රතිසංස්කරණය සඳහා උපයෝජනය වී ඇත. මෙම අරමුදල් ශ්‍රී ලංකා රජයට ලැබුණු ප්‍රදානයන් වේ.

**උපයෝජනය (ඇ.ඩො. මිලියන)**




අච්චුවේලි කාර්මික ජනපදය
යාපනය දොරෙයියප්පා ක්‍රීඩාංගණය නවීකරණය
උතුරු පළතේ නිවාස ඒකක 41,000ක් ඉදිකිරීම
යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා ඉංජිනේරු පීඨ වෙත පහසුකම්
උතුරු දුම්රිය මාර්ග නවීකරණය
• මැදවච්චිය - තලෙයිමන්නාරම
• ඕමන්ත- කන්කසන්තුරේ
වව්නියාව දිස්ත්‍රික් රෝහලෙහි ඇඳන් 200ක් සහිත වාට්ටු සංකීර්ණයක් ඉදිකිරීම
විසල් දඹුල්ල ජල සම්පාදන ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලබන ප්‍රදේශය
නැගෙනහිර පළාතේ නිවාස ඒකක 5,000ක් ඉදිකිරීම
හැටන් දික්ඔය ඇඳන් 150ක් සහිත මූලික රෝහලක් ඉදිකිරීම
ඌව සහ මධ්‍යම පළාත තුළ නිවාස 4,000ක් ඉදිකිරීම
මුහුදුබඩ දුම්රිය මාර්ගයේ තත්ත්වය උසස් කිරීම
හම්බන්තොට කාවණ්තිස්සපුර කාර්මික කලාපය
රුහුණු විශ්වවිද්‍යාලය සඳහා නවීන පහසුකම්වලින් යුත් ශ්‍රවණාගාරයක් ඉදිකිරීම
Kankesanthurai
Kilinochchi
Talaimannar
Omanthei
Madu
Vavunia
Trincomalee
Madawachchi
Wilpattu National Park
Puttalam
Anuradhapura
Somawathie Chaitiya Sanctuary
Batticaloa
Wasgamuwa National Park
Knuckles Forest Reserve
Kandy
Gal Oya National Park
Nuwara Eliya
Badulla
Colombo
Hatton
Horana
Avissawella
Yala National Park
Udawalawe National Park
Kalutara
Sinharaja Forest Reserve

## උතුරු දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම

ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශය රටෙහි අනෙකුත් ප්‍රදේශ සමඟ සම්බන්ධ කළ හැකි වැදගත්ම සාධකය වන්නේ උතුරු දුම්රිය මාර්ග සේවාව ප්‍රතිස්ථාපනය බව හඳුනා ගැනිණි. දශක තුනක අර්බුදය නිම වූ වහාම 2010 දී ශ්‍රී ලංකා රජය විසින් ඉන්දියානු ආනයන අපනයන බැංකුව හරහා ඉන්දීය රජය වෙතින් සම්පූර්ණ උතුරු දුම්රිය මාර්ග ජාලයම පුනරුත්ථාපනය කිරීම සඳහා ණය ආධාරයක් ලබාගන්නා ලදි. ඒ අනුව ඕමන්ත සිට පලෙයි දක්වා, මැදවච්චිය සිට මධුපාර දක්වා, මධුපාර සිට තලෙයිමන්නාරම දක්වා, පලෙයි සිට කන්කසන්තුරේ දක්වා දුම්රිය මාර්ග පුනරුත්ථාපනය සඳහා ඇ.ඩො. මිලියන 416.39ක ණය මාලාවකට අත්සන් තැබිණි. මේ යටතේ ආවරණය වන මුළු දුම්රිය මාර්ග දිග කිලෝමීටර් 196ක් වේ. පලෙයි සිට කන්කසන්තුරය දක්වා කිලෝමීටර 56ක දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමටත් මුළු උතුරු දුම්රිය මාර්ගයේම සංඥා හා විදුලි සංදේශන පහසුකම් වැඩිදියුණු කිරීමටත් ඇ.ඩො. මිලියන 382.37ක් පමණ වූ ණය මාලාවකට 2012 දී අත්සන් තැබිණි. ඒ අනුව මේ වන විට දුම්රිය මාර්ග පුනරුත්ථාපනය සම්පූර්ණ කර ඇති අතර දුම්රිය ධාවනය ද මේ වනවිට ආරම්භ කර තිබේ.

# පාකිස්තානය

ශ්‍රී ලංකාව සහ පාකිස්තානය යනු දකුණු ආසියානු කලාපයේ පිහිටා ඇති රටවල් දෙකක් වන අතර ශ්‍රී ලංකාව පාකිස්තානය වෙතින් ණය හා ප්‍රදාන ලෙස සහාය ලබාගෙන තිබේ. ශ්‍රී ලංකාව වෙත පාකිස්තානයෙන් ලැබුණු ප්‍රථම ණය ආධාරය වන්නේ 1991 දී දුම්රිය මැදිරි සඳහා ලබාගත් ඇ.ඩො. මිලියන 5ක ණය ආධාරයයි.

පාකිස්තානු රජය 2011 දී ගම්පහ දිස්ත්‍රික්කයේ බාබුසලාම් මහා විද්‍යාලයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් ඇ.ඩො. 125,000ක ප්‍රදානයක් ලබාදුන් අතර වව්නියාව අල්-ආක්ෂා මහා විද්‍යාලය වෙත ඇ.ඩො. 90,000ක ප්‍රදානයක් 2012 දී ලබා දුන්නේ ය.

පාකිස්තානු සහාය තවදුරටත් ව්‍යාප්ත කරමින් 2013 දී ගම්පහ දිවුලපිටිය ප්‍රදේශයේ අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්තයට සහායක් වෙමින් ඇ.ඩො. 72,000ක ප්‍රදානයක් ලබාදෙන ලදි. මේ යටතේ මෙම ප්‍රදේශයේ ප්‍රතිලාභීන් 75 දෙනෙකු අතර පේෂකර්ම අත්‍යන්ත්‍ර බෙදාදෙනු ලබයි.

පාකිස්තානු රජය 2014 වර්ෂයේදී පහත ව්‍යාපෘති සඳහා ප්‍රදානයන් ලබාදෙන ලදි.

| ව්‍යාපෘතිය | මුදල (ඇ.ඩො) |
|---|---|
| මන්නාරම සහ වව්නියා දිස්ත්‍රික්කවල අභ්‍යන්තර අවතැන්වූවන් සඳහා වන නිවාස වැඩසටහන | 1,000,000 |
| වව්නියාව අල්-ආක්ෂා මහා විද්‍යාලයේ පාසල් ගොඩනැගිල්ල සඳහා තවත් අතිරේක මහල් දෙකක් ගොඩනැගීම | 30,000 |
| මහනුවර, අකුරණ ෂියා රෝහලෙහි සෞඛ්‍යාරක්ෂණ සේවාවන් ශක්තිමත් කිරීම | 17,000 |
| මහනුවර බදියුදීන් මොහමඩ් කාන්තා විද්‍යාලය වෙත ලබාදුන් අනුග්‍රහය | 6,500 |

# රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර අංශය


බටහිර අර්ධ ගෝලයේ ඇති රටවලින් ශ්‍රී ලංකාවේ හඳුනාගත් සංවර්ධන අභිමතාර්ථ මුදුන් පමුණුවා ගැනීම උදෙසා තිල සංවර්ධන සහායයන් එක් රැස් කිරීම විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ දියුණු ආර්ථික අංශය මගින් සිදු කෙරේ. ශ්‍රී ලංකාවට මූල්‍ය ආධාර ලබාදෙන ප්‍රධානතම දායකයින් වන්නේ ජර්මනිය, නෙදර්ලන්තය, ස්වීඩනය, යුරෝපා සංගමය, ඇමරිකා එක්සත් ජනපදය, ප්‍රංශය, ස්පාඤ්ඤය, ඔස්ට්‍රියාව, ඩෙන්මාර්කය, බෙල්ජියම, රුසියාව, ඕස්ට්‍රේලියාව, එක්සත් රාජධානිය හා හංගේරියාවයි.

2010 වසරේදී ශ්‍රී ලංකාව මැදි ආදායම් ආර්ථිකයක් දක්වා ක්‍රමයෙන් වෙනස්වීමත් සමඟ බටහිර රටවලින් හා ණය නියෝජිතායතන වලින් ලැබෙන විදේශ මූල්‍යයන්හි සංයුතිය හා ස්වරූපය සැලකිය යුතු පරිදි වෙනස් වී ඇත. අඩු පොළී අනුපාතිකයන් සමඟ ලැබෙන සහනදායී මූල්‍යයනයන්හි අඩුවීම හේතු කොට ගෙන මෙකී රටවලින් හා ආයතනවලින් ලබාගන්නා සංවර්ධන සහය සහනදායී නොවන හා සහනදායී ණය පහසුකම් සංකලනයක් සහ අපනයන ණය දක්වා වෙනස් වීමට ලක්වී ඇත.

මෙකී මූල්‍යයනයන් ප්‍රධාන වශයෙන් i) අපනයන ණය ii) වාණිජ ණය iii) සම්ප්‍රදායක ණය ආධාර iv) ප්‍රදාන ආධාර යන ස්වරූපයන්ගෙන් ලබාගන්නා ලදි. අපනයන ණය යටතේ ලැබෙන විදේශ මූල්‍යයනයන් මූලිකවම ණය ආපසු ගෙවීම ආවරණය කිරීම උදෙසා ප්‍රමාණවත් ආර්ථික ප්‍රතිලාභ හෝ ආදායම් මාර්ගයන් උත්පාදනය කළ හැකි වාණිජමය වශයෙන් සාධනීය ව්‍යාපෘතීන්හි ආයෝජනය කර ඇත. ඒ අනුව බටහිර රටවලින් ලැබෙන වාණිජ ණය වලින් වැඩි සංඛ්‍යාවක් මාර්ග, පාලම් හා ජල සම්පාදන වැනි කඩිනම් හා පූර්වතා සංවර්ධන ව්‍යාපෘති සහ ජනතාව සඳහා ගුණාත්මක, උසස් තාක්ෂණික හා විශ්වාසනීය සෞඛ්‍යාරක්ෂණ පහසුකම් සලසාදීමේ අරමුණින් යුතුව රෝහල් සංවර්ධනය හා සෞඛ්‍යාරක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම වැනි සමාජ යටිතල පහසුකම් ව්‍යාපෘති සම්පූර්ණ කිරීම සඳහා භාවිතා කරනු ලැබ ඇත.

## එකඟතා හා උපයෝජන

**දියුණු ආර්ථිකයන්ගෙන් 2005-2014 වසරේ ශ්‍රී ලංකාවට ලැබුණු මූල්‍ය සහයෝගීතාවයන්හි එකඟතා හා උයෝජනයන්**




| | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| එකඟතා | 513.0 | 398.5 | 337.0 | 439.0 | 138.0 | 547.2 | 124.0 | 234.0 | 487.5 | 370.0 | **3476** |
| උපයෝජන | 193.0 | 283.0 | 264.0 | 313.0 | 295.0 | 361.0 | 202.0 | 223.0 | 312.4 | 246.3 | **2573** |

## 2014 වසරේ දී සිදුකරන ලද විදේශීය මූල්‍ය එකඟතාවයන්

පහත ව්‍යාපෘතීන් දියුණු රටවල (බටහිර) වාණිජ ණය, අපනයන ණය සහ ප්‍රදාන යටතේ ක්‍රියාත්මක කිරීම උදෙසා ඊට අදාල මූල්‍යමය පහසුකම් සැලසීම වෙනුවෙන් අදාල පියවරයන් 2014 වසරේදී නිම කරනු ලැබීය.

| සංවර්ධන පාර්ශ්වකරු | ව්‍යාපෘතිය | මුදල (ඇ.ඩො. මිලියන) |
|---|---|---|
| ඩොයිෂ් බැංකුව ඒ ජී | ග්‍රාමීය පාලම් 537ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 150.0 |
| ප්‍රංශ සංවර්ධන ආයතනය (AFD) | අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීම හා බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය | 70.0 |
| කේ බී සී බැංකුව, බෙල්ජියම | මොණරාගල බුත්තල ජල සම්පාදන යෝජනා ක්‍රමය | 13.6 |
| නෙදර්ලන්තයේ රාබෝ බැංකුව හා ඕස්ට්‍රේලියානු අපනයන මූල්‍ය රක්ෂණ සමාගම (EFIC) | කිරි ගවයින් 2,500ක් ආනයනය කිරීමේ ව්‍යාපෘතිය | 20.7 |
| ජර්මන් රජය | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතිය | 2.1 |
| ජර්මන් රජය | සමාජ ඒකාබද්ධතාව හා පරිවර්තනය පහසු කිරීමේ ව්‍යාපෘතිය | 2.6 |
| රාබෝ බැංකුව, නෙදර්ලන්තය | ග්‍රාමීය පාලම් 463ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 110.6 |
| | **එකතුව** | **369.76** |

## 2014 වසරේදී ණය සම්මුති නිම කරන ලද ව්‍යාපෘතීන්

2014 වසරේදී ණය සම්මුති සාකච්ඡා නිම කරන ලද ව්‍යාපෘතින් පහත දැක්වේ.

| සංවර්ධන පාර්ශ්වකරු | ව්‍යාපෘතිය | මුදල (ඇ.ඩො. මිලියන) |
|---|---|---|
| නෙදර්ලන්තයේ රාබෝ බැංකුව හා ඕස්ට්‍රේලියානු අපනයන මූල්‍ය රක්ෂණ සමාගම (EFIC) | කිරි ගවයින් 20,000ක් ආනයනය කිරීමේ ව්‍යාපෘතිය | 73.0 |
| ඕස්ට්‍රේලියානු අපනයන මූල්‍ය රක්ෂණ සමාගම (EFIC) හා ඕස්ට්‍රේලියානු ඒ එන් ඉසෙඩ් බැංකුව | අම්පාර ජල යෝජනා ක්‍රමයේ අදියර III සඳහා අතිරේක මුදල් ලබා ගැනීම | 7.5 |
| ක්‍රෙඩිට් ඇග්‍රිකෝල් බැංකුව, ප්‍රංශය | විසල් මාතලේ ජල සම්පාදන යෝජනා ක්‍රමය | 130.7 |
| ස්පාඤ්ඤය රජය හා ස්පාඤ්ඤය බීබීවීඒ බැංකුව | රාජගිරිය, ගනේමුල්ල හා පොල්ගහවෙල ගුවන් පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 49.0 |
| ප්‍රංශ සංවර්ධන ආයතනය (AFD) | ග්‍රිඩ් උපපොළ 4ක් හා ඊට අදාල සම්ප්‍රේෂණ පද්ධති මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 32.0 |
| ප්‍රංශ සංවර්ධන ආයතනය (AFD) | හරිත බලශක්ති සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 23.0 |

| සංවර්ධන පාර්ශ්වකරු | ව්‍යාපෘතිය | මුදල (ඇ.ඩො. මිලියන) |
|---|---|---|
| ස්පාඤ්ඤ රජය | ආණමඩුව ජල සම්පාදන යෝජනා ක්‍රමය | 32.0 |
| හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකුව හා හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකුව කොළඹ ශාඛාව | කලමැටිය සාගර විශ්වවිද්‍යාල වැඩිදියුණු කිරීම | 82.4 |
| හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකුව හා හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකුව කොළඹ ශාඛාව | බඩල්ගම කිරි සැකසුම් මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම | 78.4 |
| රාබෝ බැංකුව, නෙදර්ලන්තය | ශ්‍රී ලංකා වරාය අධිකාරියට ඝන මීටර් 4,000ක දියයට මඩ හැරීම සඳහා භාවිතා කරන යාත්‍රාවක් සැපයීම | 39.6 |
| රාබෝ බැංකුව, නෙදර්ලන්තය | බෙලිඅත්ත දිස්ත්‍රික් රෝහල විශේෂිත මාතෘ හා ළමා රෝහලක් ලෙස සංවර්ධනය කිරීම | 30.4 |
| | එකතුව | 497.5 |

# 2014 වර්ෂයේදී ක්‍රියාවට නංවමින් පැවති ප්‍රධාන ව්‍යාපෘති

## මොණරාගල-බුත්තල ජල සම්පාදන ව්‍යාපෘතිය

සියයට 43.5ක් පමණ වන ජාතික පානීය නල ජල සම්පාදන ආවරණය සමඟ සංසන්දනය කරන විට මොණරාගල දිස්ත්‍රික්කයේ නල ජල සම්පාදනයෙන් ආවරණය කරන්නේ සියයට 20ක ප්‍රමාණයකි. දිස්ත්‍රික්කය තුළ දැනට ක්‍රියාත්මකව පවතින පානීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළින් මොණරාගල-බුත්තල යන නගර ආවරණය වන පරිදි අඛණ්ඩ ජල සම්පාදනයක් ලබාදිය නොහැකි අතර එය මඩුල්ල ඔක්කම්පිටිය වැනි නගරබද ප්‍රදේශයන්හි පානීය ජල අවශ්‍යතා ආවරණය කිරීම උදෙසා ප්‍රමාණවත් නොවේ. යෝජිත මොණරාගල-බුත්තල ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ දිනකට ඝන මීටර 6,000ක ධාරිතාවකින් යුත් ජල පවිත්‍රාගාරයක් ඉදිකිරීම හා ග්‍රාමනිලධාරි කොට්ඨාශ 43ක් ආවරණය කරමින් කිලෝමීටර 110ක ජලය බෙදා හැරීමේ ජාලයක් ඉදිකරනු ලබයි. ඒ මගින් ප්‍රදේශයේ ජීවත් වන පවුල් 50,000ක් හා වාණිජ හා කාර්මික අංශ සඳහාද පානීය නල ජලය ලබා දීමට හැකිවේ. මොණරාගල-බුත්තල ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා බෙල්ජියමේ KBC බැංකුව යටතේ යුරෝ මිලියන 12.9ක් හා හැටන් නැෂනල් බැංකුව යටතේ යුරෝ මිලියන 8.98ක් ලබා ගැනීම සඳහා ණය ගිවිසුම්වලට එළඹෙන ලදි.

## ග්‍රාමීය පාලම් 1,000ක් ඉදිකිරීම

දුරස්ථ ගම්මානවලටද ජාතික මට්ටමේ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රතිලාභ උපරිම අයුරින් ලබාදීමට අරමුණු කොට රට තුළ මාර්ග සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සඳහා රජය ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී ඇත. ඒ අනුව ග්‍රාමීය පාලම් 1,000ක් ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලන්ඩනයේ ඩොයිෂ් බැංකුව හා නෙදර්ලන්තයේ රාබෝ බැංකුව සමග ණය ගිවිසුම්වලට එළඹෙන ලදි. මෙමඟින් පසුගාමී ගම්මාන විශාල ප්‍රමාණයකට ප්‍රවාහන පහසුකම් ලබාදීම තුළින් වෙළඳපොළ, අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් උදෙසා ග්‍රාමීය ජනතාවට ඇති ප්‍රවේශයන් ඉහළ නැංවීමට බලාපොරොත්තුවේ.

## කිරි ගවයින් ආනයනය කිරීම

දේශීය දියර කිරි කර්මාන්තය, පරිසරයට සිදුවන හානි අවම කරමින් සාධාරණ ලාභ පරිමාවක් පවත්වා ගනිමින් සැලකිය යුතු ප්‍රමාණයක ගුණාත්මක දියර කිරි නිෂ්පාදනයක් වර්තමාන වෙළඳපොළට ඉදිරිපත් කිරීමෙහිලා විභවතාවයක් පවතී. කෙසේ වුවද, ගුණාත්මක කිරි දෙනුන්ගේ පවත්නා හිඟය මෙම කිරි නිෂ්පාදන කර්මාන්තයේ වර්ධනයට බාධාවක්ව පවතී. එසේම ඉහළ ගුණත්වයකින් යුත් අභිජනන සත්වයන්ගේ හිඟකමද කර්මාන්තයේ ගුණාත්මක බව අඩුවීමට හේතුවී ඇත.

එබැවින්, යෝජිත ව්‍යාපෘතිය මගින් කිරිගවයන් 2,500ක් ආනයනය කිරීම සැලකිය යුතු ප්‍රමාණයක ගුණාත්මක කිරි හා ඒ හා ආශ්‍රිත නිෂ්පාදනයන් සහතික කෙරෙනු ඇත. එසේම ව්‍යාපෘතිය මගින් රිදීයගම ගොවිපල සංවර්ධනය කිරීම තුළින් විශේෂයෙන් දකුණු පළාත තුළ සත්ව අභිජනන අවශ්‍යතා සම්පූර්ණ කිරීමටද හැකියාවක් ලැබෙනු ඇත.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමත් සමග රටේ දියර කිරි නිෂ්පාදනය ඉහල නැංවීමට අපේක්ෂිතය. එසේ කිරි නිෂ්පාදන වෙනුවෙන් රටින් පිටත ගලායන විදේශ විනිමය ඉතිරි කර ගැනීම අරමුණු අතර වේ. මෙම යෝජිත ව්‍යාපෘතිය මඟින් රැකියා විශාල ප්‍රමාණයක් උත්පාදනය කිරීමට නියමිත අතර එමෙන්ම ග්‍රාමීය දුගීබව හා මන්ද පෝෂණය අවම කිරීමෙහිලා මෙම ව්‍යාපෘතිය මනා පිටුවහලක් වන බවට නිසැකය.

# එක්සත් ජාතීන්ගේ සංවිධාන සහ තාක්ෂණික ආධාර අංශය

## එක්සත් ජාතීන්ගේ සංවිධාන

1952 වසරේ සිට ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO), එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF), ලෝක ආහාර වැඩසටහන (WFP), එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA), සරණාගතයින් සඳහා වන එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් කාර්යාලය (UNHCR), ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO), එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන (UN Habitat), අන්තර්ජාතික කම්කරු සංවිධානය (ILO) සහ කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල (IFAD) වැනි එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන වෙතින් ධීවර, පරිසරය, සෞඛ්‍යය, අධ්‍යාපනය, ජීවනෝපාය සංවර්ධනය, ආපදා සහන වැනි ප්‍රධාන ක්ෂේත්‍රයන්හි විවිධ ව්‍යාපෘතීන් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සැළකිය යුතු මූල්‍ය හා තාක්ෂණික ආධාර ලබා ගනී. ශ්‍රී ලංකා රජය සහ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන විසින් ඒකාබද්ධව එකඟ වූ එක්සත් ජාතීන්ගේ සංවර්ධන සහයෝගීතා රාමුව හරහා මෙම ආධාර ලබාදේ. වර්තමාන සහයෝගීතා රාමුව යටතේ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන 2013 වසරේ සිට වසර 05ක කාලයක් සඳහා ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 405ක් පමණ ලබාදීමට එකඟවී ඇත. එක්සත් ජාතීන්ගේ ආධාර, ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවට ලැබෙන්නේ ප්‍රදාන වශයෙන් වන නමුත් කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල, ප්‍රදාන වශයෙන් මෙන්ම සහනදායි ණය ලෙසද තම සහයෝගය ලබාදේ.

### එකඟතාවයන්

2014 වසරේ දී ශ්‍රී ලංකා රජය සහ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන විසින් පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘතීන් සඳහා අත්සන් තබා ඇත.


| නියෝජිතායතනය | ව්‍යාපෘතිය | මුදල (ඇ.ඩො. මිලියන) |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | 2014-2018 කාලපරිච්ඡේදය සඳහා වූ ආපදා කළමනාකරණ වැඩසටහන | 0.78 |
| | ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාසයන් නිසා ඇතතිවන පසු අවදානම යථා තත්වයට පත් කිරීම හා සංවර්ධනය. | 3.12 |
| ආහාර හා කෘෂිකර්ම සංවිධානය | ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා (Quinoa) කුනා නැමති බෝගය හඳුන්වාදීම සඳහා තාක්ෂණික ආධාර ලබාදීම | 0.12 |
| | සාර්ක් කලාපීය රටවල උයන් වතු දාමයන්හි පසු අස්වනු හානි අවම කර ගැනීමේ වැඩසටහන | 0.49 |
| | කිරි ගවයන් සඳහා සුදුසු පෝෂණ තාක්ෂණ ක්‍රමවේදයන් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන | 0.27 |
| | ශ්‍රී ලංකාවේ කුඩා මත්ස්‍ය සම්පත් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | 0.34 |
| ලෝක ආහාර වැඩසටහන | දිගුකාලීන සහන සහ ප්‍රතිෂ්ඨාපන මෙහෙයුම් වැඩසටහන | 23.48 |

මීට අමතරව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන සහයෝගීතා රාමුවට අනුකූලව 2013 සිට 2017 කාලපරිච්ඡේදයට අදාලව අත්සන් කරන ලද එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල, එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල යන නියෝජිතායතනයන්ට අදාල දේශීය වැඩසටහන් යටතේ පිළිවෙලින් ඇ.ඩො. මිලියන 60, ඇ.ඩො. මිලියන 60 සහ ඇ.ඩො. මිලියන 12ක එකඟතා ලබාදීමට එම ආයතන විසින් එකඟ වී ඇත.

# උපයෝජනයන්

පහත ප්‍රස්ථාරයේ පෙන්නුම් කෙරෙන ආකාරයට විශේෂයෙන්ම වැවිලි කර්මාන්තය, ධීවර හා වාරිමාර්ග යන ක්ෂේත්‍රයන්ට අදාල ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල වෙතින් 2014 වසරේ ඉහළම උපයෝජනයන් වාර්තා වී ඇත.

**2014 වසරේ උපයෝජන ප්‍රතිශතය**




# අවසන් වූ ප්‍රධාන ව්‍යාපෘති

2014 වසරේ දී අවසන් වූ කෘෂිකර්මය, ජීවනෝපාය සංවර්ධනය හා පරිසරය වැනි ක්ෂේත්‍රයන්හි ව්‍යාපෘතීන් පහත වගුව මඟින් දක්වා ඇත.

| **නියෝජිතායතනය** | **ව්‍යාපෘතිය** | **මුදල (ඇ.ඩො. මිලියන)** |
|---|---|---|
| **ප්‍රදාන** | | |
| ආහාර හා කෘෂිකර්ම සංවිධානය | කිලිනොච්චිය සහ මුලතිව් දිස්ත්‍රික්කයන්හි ඒකාබද්ධ වාරිමාර්ග හා කෘෂිකාර්මික ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය | 5.10 |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | ඕසෝන් වියන ආරක්ෂා කර ගැනීම සඳහා ආයතනික සවිබල ගැන්වීම (අදියර 9) | 0.13 |

# තාක්ෂණික ආධාර

රටෙහි ඉදිරි සංවර්ධන න්‍යාය පත්‍රය ප්‍රධාන වශයෙන් යොමු වී ඇත්තේ දැනුම මූලික කරගත් ආර්ථිකයක් ගොඩනැංවීම සඳහාය. මෙම අරමුණ ළඟා කර ගැනීම සඳහා රාජ්‍ය අංශයේ මානව සම්පත් අඛණ්ඩ සංවර්ධනය හා හැකියාවන් ගොඩනැංවීම ඉතා වැදගත් වේ. ඒ අනුව, විදේශීය පුහුණු අවස්ථාවන් උපයෝජනය කිරීම සඳහා ශ්‍රී ලාංකීය කේන්ද්‍රස්ථානය වශයෙන් කටයුතු කරන විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් ද්විපාර්ශ්වික සංවර්ධන පාර්ශ්වකරුවන් වන ඕස්ට්‍රේලියාව, චීනය, ජපානය, කොරියාව, ඉන්දියාව, සිංගප්පූරුව, තායිලන්තය, මැලේසියාව, ඉන්දුනීසියාව හා බහුපාර්ශ්වීය සංවර්ධන පාර්ශ්වකරුවන් වන ආසියානු සංවර්ධන බැංකුව, කොළඹ ක්‍රමය සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලය සමඟ අවස්ථානුකූලව සාකච්ඡා පවත්වමින් සහ එම පාර්ශ්වකරුවන් සමග දැඩි සම්බන්ධතාවයෙන් කටයුතු කරනු ලබයි.

ශ්‍රී ලංකා රජය විසින් සංවර්ධන පාර්ශ්වකරුවන් 15කට වඩා වැඩි ප්‍රමාණයකගෙන් ශිල්පීය ආධාර වැඩසටහන යටතේ දිගුකාලීන (මාස 8 හෝ වැඩි) සහ කෙටි කාලීන පුහුණු අවස්ථාවන් 600ක් පමණ වාර්ෂිකව ලබාගනී. ඒ අනුව, 2014 වර්ෂයේ දී විදේශ පුහුණු අවස්ථා 1,086ක් ලැබුණු අතර ඉන් 71ක් දිගුකාලීන පුහුණු අවස්ථා සහ ඉතිරිය කෙටිකාලීන පුහුණු අවස්ථා විය. 2014 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රජය වෙත ලැබුණු පුහුණු අවස්ථා පහත වගුවෙන් දක්වා ඇත.

**සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් 2014 වසර සඳහා ලබාදුන් විදේශ පුහුණු අවස්ථා**

| සංවර්ධන පාර්ශ්වකරු | කෙටි කාලීන | දිගු කාලීන |
|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකුව | 64 | |
| කොළඹ ක්‍රමය | 11 | 1 |
| පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලය | 29 | |
| ඕස්ට්‍රේලියාව | | 35 |
| චීනය | 453 | |
| මැලේසියාව | 9 | |
| සිංගප්පූරුව | 35 | 1 |
| තායිලන්තය | 26 | 8 |
| කොරියාව | 199 | 9 |
| ඉන්දියාව | 64 | |
| ජපානය | 101 | 17 |
| සාර්ක් | 16 | |
| ඊජිප්තුව | 4 | |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | 3 | |
| ලෝක බැංකුව | 1 | |
| **එකතුව** | **1,015** | **71** |

පසුගිය වර්ෂ තුළදී, පුහුණු අවස්ථාවන්හි අනපේක්ෂිත වර්ධනයක් සිදු විය. උදාහරණයක් ලෙස 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා නිලධාරීන් 453ක් චීනයෙහි විදේශ අත්දැකීම් ලබා ගැනීමට තේරීපත් වූ අතර එක් වැඩසටහනක් සඳහා උපරිම වශයෙන් නිලධාරීන් 8 දෙනෙකු තේරී පත් වී ඇත. මෙය 2014 වසරේ ශ්‍රී ලංකාව ලබාගත් මුළු පුහුණු අවස්ථාවන්ගෙන් සියයට 42ක ප්‍රතිශතයකි. මෙම පුහුණු වැඩසටහන් සඳහා අයදුම්කරන ලද සියලුම අයදුම්කරුවන් එම වැඩසටහන් සඳහා තෝරා පත් කර ගැනීමට චීන රජය විසින් ඔවුන්ගේ උපරිම උත්සාහය දරා ඇත.

ඕස්ට්‍රේලියානු රජය ඕස්ට්‍රේලියානු සංවර්ධන ශිෂ්‍යත්ව ලබාදීම ඉහළ නංවා ඇති අතර සෞඛ්‍යය, අධ්‍යාපනය සහ චිරස්ථායි ආර්ථික සංවර්ධනය යන අංශ යටතේ අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් නිලධාරීන් 35 දෙනෙකු ශාස්ත්‍රපති උපාධිය හැදෑරීම සඳහා තේරිපත්වී ඇත. කොරියානු රජය, කොරියානු අන්තර්ජාතික සහයෝගීතා ආයතනය මඟින් කෙටිකාලීන පුහුණු අවස්ථා 199ක් සහ දිගු කාලීන පුහුණු අවස්ථා 9ක් ලබාදී ඇත. මෙය 2014 වර්ෂයේ දී ශ්‍රී ලංකාව වෙත ලැබුණු මුළු පුහුණු අවස්ථාවන්ගෙන් සියයට 16ක ප්‍රතිශතයකි. ජපාන රජයද කෙටි හා දිගු කාලීන පුහුණු අවස්ථා ලබා දී ඇති අතර එය මුළු පුහුණු අවස්ථාවන්ගෙන් සියයට 11ක ප්‍රතිශතයකි. එසේම ඉන්දියානු රජය, සිංගප්පූරුව හා ආසියානු සංවර්ධන බැංකුව 2014 වසරේ දී සැලකිය යුතු පුහුණු අවස්ථාවන් ප්‍රමාණයක් ලබා දී ඇත.

ශ්‍රී ලංකා රජය වෙත ලැබුණු දිගුකාලීන පුහුණු අවස්ථාවන් සලකා බැලීමේදී පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ ශාස්ත්‍රවේදී උපාධි වැඩි වශයෙන් ලබා දී ඇත්තේ කණිෂ්ඨ සහ මැදි මට්ටමේ නිලධාරීන් හට ඔවුන්ගේ අනාගත වෘත්තීය සංවර්ධනය සඳහා අධ්‍යාපනික සහ වෘත්තීය කුසලතා වැඩිදියුණු කර ගැනීමටය. මැදි හා ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය නිලධාරීන් හට අදාල අංශයන්හි ඔවුන්ගේ පවත්නා දැනුම සහ කුසලතාවයන් වැඩිදියුණු කරගැනීමට කෙටිකාලීන පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, සමුළු හා වැඩමුළු ලබාදී ඇත. මෙම පුහුණු වැඩසටහන් ප්‍රධාන වශයෙන් කෘෂිකර්මය, පශුසම්පත්, ධීවර හා වාරිමාර්ග, මහාමාර්ග හා ප්‍රවාහනය, සෞඛ්‍යය, ව්‍යාපාර සංවර්ධනය, පරිසරය, අධ්‍යාපනය, රාජ්‍ය පරිපාලනය, යහපාලනය සහ සංවර්ධනය හා රාජ්‍ය ප්‍රතිපත්ති යන අංශයන් මූලික කරගෙන ඇත. තනි පුද්ගල පුහුණු වැඩසටහන්වලට අමතරව, සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් කණ්ඩායම් පුහුණු, වැඩමුළු සහ අධ්‍යාපන සංචාර රාජ්‍ය අංශයේ නිලධාරීන් හට ලබාදෙනු ලැබේ.

## ස්වේච්ඡා සේවය

පුහුණු වැඩසටහන්වලට අමතරව, ශිල්පීය ආධාර අංශය විසින් සංවර්ධන පාර්ශ්වකරුවන් සහ රේඛීය අමාත්‍යාංශ සමඟ විදේශ විශේෂඥ සහ ස්වේච්ඡා සේවක වැඩසටහන් සංවිධානය කරනු ලබයි. රේඛීය අමාත්‍යාංශ මඟින් කරනු ලබන ඉල්ලීම් පාදක කරගනිමින් සුදුසු විශේෂඥයින්/ස්වේච්ඡා සේවකයින් හඳුනාගෙන ඔවුන් සේවයේ යෙදවීමට පියවර ගනු ලබයි. 2014 වසර තුළදී ශ්‍රී ලංකා රජය විසින් කොරියාව, ජපානය සහ ඕස්ට්‍රේලියාවෙන් ස්වේච්ඡා සේවකයින් පිළිවෙලින් 51, 58 සහ 02ක් ලෙස සෞඛ්‍යය, සමාජ, සමාජීය සංවර්ධනය, ක්‍රීඩා, අධ්‍යාපන, භාෂාව, රෙදිපිළි සහ තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍රවලින් ලබාගෙන ඇත.

# ප්‍රාග්ධන වෙළඳපොළ අංශය

රජයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය බැංකු වෙතින් මූල්‍ය සම්පාදනය කිරීම, රජය හා රාජ්‍ය ව්‍යවසායන් සඳහා ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළ තුළින් ප්‍රාග්ධනය සම්පාදනය කරගැනීම සඳහා පහසුකම් සැලසීම සහ දේශීය ණය ප්‍රාග්ධන වෙළඳපොළ අධීක්ෂණය කිරීම ප්‍රාග්ධන වෙළඳපොළ අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

## දේශීය බැංකුවලින් මූල්‍යයනය සම්පාදනය කිරීම

මාර්ග සංවර්ධන අධිකාරියට, මාර්ග සංවර්ධන ව්‍යාපෘති 64ක් මූල්‍යයනය කිරීම සඳහා රුපියල් බිලියන 151.7ක් දක්වා දේශීය බැංකුවලින් අරමුදල් සම්පාදනය කර ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ සඳහා 2014 වර්ෂය තුළ ප්‍රාග්ධන වෙළඳපොළ අංශය විසින් මාර්ග සංවර්ධන ව්‍යාපෘති 22ක් මූල්‍යයනය කිරීම සඳහා රුපියල් බිලියන 33.4ක පමණ දේශීය බැංකු අරමුදල් සපයාදීමට ක්‍රියා කර ඇත.

තවද, මෙම ප්‍රමුඛ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවලට අමතරව, කොළඹ කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ (CKE) වැඩ විෂය පථයෙහි වෙනස්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීම, පිටත වටරවුම් අධිවේගී මාර්ගය (OCH) අදියර III කඩවත සිට කෙරවළපිටිය දක්වා වූ කොටසෙහි කොන්ත්‍රාත් සුපරීක්ෂණය සඳහා උපදේශන සේවා සැපයීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීම ආදී විදේශ අරමුදල්වලින් ක්‍රියාත්මක වන මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවලට අවශ්‍ය හිඟ අරමුදල් දේශීය බැංකු වෙතින් සම්පාදනය කරගැනීම සඳහා ද, පහසුකම් සලසන ලදි.

ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය වර්ෂ 2013 දී ජල සම්පාදන ව්‍යාපෘතිවල ආයෝජනය කිරීමට රුපියල් බිලියන 29.1ක් දක්වා ද වර්ෂ 2014, ජුනි මාසයේදී අතිරේක ජල සම්පාදන ව්‍යාපෘති 04ක් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් බිලියන 10.0ක් දක්වා ද දේශීය බැංකුවලින් අරමුදල් සම්පාදනය කරගැනීමට අනුමැතිය ලබා ගෙන ඇත. ඒ අනුව, 2014 වර්ෂය තුළදී, ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයට දේශීය බැංකු සමඟ ජල සම්පාදන ව්‍යාපෘති 11ක් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් බිලියන 39.2ක් පමණ වූ ණය ගිවිසුම්වලට එළඹීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවන ලදි.

සීමාසහිත ලංකා නැව් සංස්ථාව විසින් සිය මෙහෙයුම් කටයුතු පුළුල් කිරීම සඳහා නෞකා දෙකක් (පැනමැක්ස් භාණ්ඩ ප්‍රවාහන නෞකා 02ක්) සීමාසහිත ඇවික් ඉන්ටර්නැෂනල් බීජිං සමාගම වෙතින් මිළදී ගැනීම සඳහා දේශීය බැංකුවක් වෙතින් අරමුදල් සම්පාදනය කර ගැනීමට අනුමැතිය ලබා ගන්නා ලදි. ඒ අනුව, සීමාසහිත නැව් සංස්ථාව ඇ.ඩො. මිලියන 70ක ණය මුදලක් ලබා ගැනීම සඳහා මහජන බැංකුව සමඟ ණය ගිවිසුමකට එළඹෙන ලදි. මේ වන විට ක්‍රියාත්මක වන නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ I වන අදියරට අතිරේකව, ඉදිරි වසර කිහිපය තුළ ඇරඹීමට නියමිත නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ II වන අදියරට සහ සාම්පූර් ගල් අඟුරු බලාගාරයට සැපයීමට අවශ්‍ය ගල් අඟුරු, විශාල ප්‍රමාණවලින් ආනයනය කිරීම සඳහා මෙම නෞකා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනය සංවර්ධනය කිරීම හා ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය දේශීය බැංකු අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කිරීම සඳහා 2014 වර්ෂය තුළදී, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදි. ඒ අනුව, රුපියල් බිලියන 10.3ක් වූ ණය මුදල ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරු වන ඉන්ටර්නැෂනල් කන්ස්ට්‍රක්ෂන් කොන්සෝටියම් (ICC) ආයතනය විසින් කොමර්ෂල් බැංකුව සහ හැටන් නැෂනල් බැංකුව සමඟ ණය ගිවිසුම් දෙකකට එළඹෙන ලදි. එම ණය මුදල ආපසු ගෙවීම සහ පොලී මුදල් ගෙවීම සුරක්ෂිත කිරීම සඳහා කොමර්ෂල් බැංකුව සහ හැටන් නැෂනල් බැංකුව වෙත සම්පස්ථ ණයවර ලිපියක් (Standby Letter of Credit) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලංකා බැංකුවේ විවෘත කරන ලද අතර, මහා භාණ්ඩාගාරය විසින් මෙම සම්පස්ථ ණයවර ලිපිය සුරක්ෂිත කරමින් පහසුකම් සැලසීමේ ලිපියක් (Letter of Comfort) ලංකා බැංකුව වෙත නිකුත් කරනු ලැබේ. තාක්ෂණික විද්‍යායතනය මඟින් බිහිකරනු ලබන විද්‍යාර්ථීන් ප්‍රමාණය ඉහළ නංවමින් මොරටුව විශ්වවිද්‍යාලය හා තාක්ෂණික විද්‍යායතනය යන ආයතන දෙකෙහිම අනාගත සංවර්ධනයට අදාළ සහාය ලබා දෙමින් තාක්ෂණික විද්‍යායතනය වෙනත් ස්ථානයක ස්ථාපනය කර සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධන සංස්ථාව විසින් වර්ෂ 2016 දී නිම කිරීමට අපේක්ෂිත රුපියල් බිලියන 14.2ක් පිරිවැය වූ බේරස් ගඟ වැසි ජල අපවහන හා පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමඟ ණය ගිවිසුමකට එළඹෙන ලදි.

**යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රාජ්‍ය ව්‍යවසායන්වලට දේශීය බැංකු ණය සපයා දීම**

| රාජ්‍ය ව්‍යවසායේ නම | බැංකුව | 2014.12.31 දිනට ගිවිසුම්ගත මුදල (රු බි) | 2014.12.31 දිනට උපයෝජනය වූ මුදල (රු බි) |
|---|---|---|---|
| මාර්ග සංවර්ධන අධිකාරිය - ප්‍රමුඛතා මාර්ග සංවර්ධන ව්‍යාපෘති | ලංකා බැංකුව | 36.7 | 23.6 |
| | මහජන බැංකුව | 14.6 | 13.6 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 51.4 | 21.3 |
| | හැටන් නැෂනල් බැංකුව | 32.2 | 12.0 |
| | කොමර්ෂල් බැංකුව | 7.2 | 4.5 |
| | ඩීඑෆ්සීසී බැංකුව | 1.3 | 0.9 |
| | ජාතික සංවර්ධන බැංකුව | 8.3 | 4.2 |
| මාර්ග සංවර්ධන අධිකාරිය - කොළඹ කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය | මහජන බැංකුව | ඇ.ඩො.මි 44.7 | ඇ.ඩො.මි 21.3 |
| මාර්ග සංවර්ධන අධිකාරිය - පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය | ලංකා බැංකුව | 1.8 | 0.2 |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධන සංස්ථාව | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 14.2 | 1.6 |
| ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය | ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව, හැටන් නැෂනල් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව | 18.0 | 1.5 |
| ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය | ලංකා බැංකුව | 8.6 | 2.9 |
| කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | ඇ.ඩො.මි 201.6 | රු.බි 3.16 + ඇ.ඩො.මි 76.59 |
| සීමාසහිත නැව් සංස්ථාව | මහජන බැංකුව | ඇ.ඩො.මි 70.0 | ඇ.ඩො.මි 35.0 |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව | 10.3 | 2.0 |

## බැංකු සඳහා ප්‍රාග්ධනය සම්පාදනය කරගැනීමට පහසුකම් සැලසීම

2007 වර්ෂයේ සිට රජය අරමුදල් රැස් කර ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළට ප්‍රවේශ වී ඇති ආකාරයටම 2014 වසරේ ජූනි මාසයේදී සීමාසහිත ශ්‍රී ලංකන් එයාර් ලයින් සමාගම 2019 වසරේ කල් පිරීමට නියමිත, වසර 5ක පරිණත කාලයකින් යුත් ඇ.ඩො. මිලියන 175ක් වටිනා, ජාත්‍යන්තර බැඳුම්කර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඇපකරයක් සහිතව සියයට 5.3ක් වූ ස්ථාවර පොළී අනුපාතයකට නිකුත් කරන ලදි.

තවද, ෆිච් ණය ශ්‍රේණිගත කිරීම් AAA ශ්‍රේණිය ලබා ඇති එකම දේශීය බැංකුව වන ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2014 සැප්තැම්බර් මස 10 වන දින B+(S&P) හා BB-(Fitch) නිකුතු ශ්‍රේණීන් සහිතව, අවුරුදු 5ක පරිණත කාලයකින් යුත් ඇ.ඩො. මිලියන 250ක් වටිනා ජාත්‍යන්තර බැඳුම්කර සියයට 5.15ක පොළී අනුපාතිකයකට නිකුත් කරන ලදි. මෙම බැඳුම්කරයේ ඉපයීම් බැංකුවේ ප්‍රාග්ධන වත්කම්වල ආයෝජනය කිරීමට අපේක්ෂා කරන ලදි.

**සංස්ථානික ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීම**

| නම | නිකුත් කළ දිනය | ශ්‍රේණිගත කිරීම | වටිනාකම ඇ.ඩො.මි. | කූපන් අගය (%) | කල්පිරීමේ කාලය (අවුරුදු) | කල්පිරීමේ දිනය | 2014.12.31 දිනට මිල | 2014.12.31 දිනට ඵලදාව (%) |
|---|---|---|---|---|---|---|---|---|
| **BoC'17** | 03/05/2012 | --/--/BB- | 500 | 6.875 | 05 | 03/05/17 | 103.4 | 5.306 |
| **BoC'18** | 16/04/2013 | --/--/BB- | 500 | 5.325 | 05 | 16/04/18 | 99.4 | 5.533 |
| **NSB'18** | 18/09/2013 | --/B+/BB- | 750 | 8.875 | 05 | 18/09/18 | 111.0 | 5.539 |
| **DFCC'18** | 31/10/2013 | --/B/B+ | 100 | 9.625 | 05 | 31/10/18 | 106.4 | 7.661 |
| **Airlines** | 23/06/2014 | --/B+/BB- | 175 | 5.300 | 05 | 23/06/19 | 98.7 | 5.620 |
| **NSB'19** | 10/09/2014 | --/B+/BB- | 250 | 5.150 | 05 | 10/09/19 | 98.0 | 5.641 |

*මූලාශ්‍රය: බාර්ක්ලේස් බැංකුව*
*Moody's/S&P /Fitch

## දේශීය ණය ප්‍රාග්ධන වෙළඳපොළ උපදේශනය හා ශ්‍රී ලංකා ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීම සඳහා පහසුකම් සැලසීම

ශ්‍රී ලංකාව වර්ෂ 2007 දී වසර 5ක කල් පිරීමේ කාලයක් සහිත ඇ.ඩො. මිලියන 500ක් වටිනා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සියයට 8.75ක පොලී අනුපාතිකයකට නිකුත් කරමින් ජාත්‍යන්තර ණය ප්‍රාග්ධන වෙළඳපොළ වෙත ප්‍රවේශ වන ලදි. ඉන්පසු පිළිවෙළින් 2009, 2010, 2011 හා 2012 යන වර්ෂවලදී ද, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ණය ප්‍රාග්ධන වෙළඳපොළ භාවිතා කරන ලදි.

2013 වර්ෂයේ අවසන් භාගයේදී හා 2014 වර්ෂය ආරම්භයේදී ජාත්‍යන්තර ණය ප්‍රාග්ධන වෙළඳපොළ නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව, පිළිවෙළින් 2014 ජනවාරි මාසයේදී ඇ.ඩො. මිලියන 1,000ක ද, 2014 අප්‍රේල් මාසයේදී ඇ.ඩො. මිලියන 500ක ද, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීමට පහසුකම් සලසන ලදි. මෙම බැඳුම්කර දෙක, පිළිවෙළින් සියයට 6.0 සහ 2007 වසරේ බැඳුම්කර නිකුත් කිරීම ආරම්භයේ පටන්ම ශ්‍රී ලංකා ස්වෛරීත්ව බැඳුම්කරයක් නිකුත් කරන ලද අඩුම පොලී අනුපාතිකය වූ සියයට 5.125ක පොලී අනුපාතිකයකට මිල කරන ලදි. බැඳුම්කර දෙකෙහිම කල්පිරීමේ කාලය වසර 5ක් වේ.

**ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම**

| නම | නිකුත් කළ දිනය | ශ්‍රේණිගත කිරීම | වටිනාකම ඇ.ඩො.මි. | කූපන් අගය (%) | කල්පිරීමේ කාලය (අවුරුදු) | කල්පිරීමේ දිනය | 2014.12.31 දිනට මිල | 2014.12.31 දිනට ඵලදාව (%) |
|---|---|---|---|---|---|---|---|---|
| **SL'12** | 17/10/2007 | --/B+/BB- | 500.0 | 8.250 | 5 | 17/10/12 | *Retired* | *Retired* |
| **SL'15*** | 22/01/2009 | --/B+/BB- | 500.0 | 7.400 | 6 | 22/01/15 | *Retired** | *Retired** |
| **SL'19** | 06/01/2014 | B1/B+/BB- | 1,000.0 | 6.000 | 5 | 14/01/19 | 103.7 | 4.959 |
| **SL'19** | 07/04/2014 | B1/B+/BB- | 500.0 | 5.125 | 5 | 07/04/19 | 100.0 | 5.123 |
| **SL'20** | 30/10/2010 | B1/B+/BB- | 1,000.0 | 6.250 | 10 | 30/10/20 | 103.0 | 5.629 |
| **SL'21** | 27/07/2011 | B1/B+/BB- | 1,000.0 | 6.250 | 10 | 27/07/21 | 103.0 | 5.694 |
| **SL'22** | 25/07/2012 | B1/B+/BB- | 1,000.0 | 5.875 | 10 | 25/07/22 | 101.4 | 5..648 |

*මූලාශ්‍රය: බාර්ක්ලේස් බැංකුව, එච්එස්බීසී සහ සිටි බැංකුව (Joint Lead Managers for the issuances)*

*2015 ජනවාරි මාසයේදී කල් පිරී ගෙවා පියවන ලදි.

# ණය කළමනාකරණ අංශය

## ණය කළමනාකරණ අංශයේ කාර්යභාරය

- පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා කළමනාකරණ පද්ධතිය (CS-DRMS) තුළ නව එකඟතාවයන්හි දත්ත සටහන් කිරීම, අවලංගු කිරීමේ සහ ණය/ප්‍රදාන එකඟතාවයන්හි ගැනීම් කාල සීමාවන්ගේ වර්ධනය පිළිබඳ උප ඇමුණුම්වල දත්ත සටහන් කිරීම.
- පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා කළමනාකරණ පද්ධතිය (CS-DRMS) අනුව ගෙවීම් සඳහා පුරෝකතන අගයන් ණය ලබාදෙන නියෝජිතායතන අගයන් සමග සංසන්දනය කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවට මුදල් ගෙවීම් පිළිබඳව උපදේශ ඉදිරිපත් කිරීම.
- ණය එකඟතාවයන්ට අනුව පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා කළමනාකරණ පද්ධතිය (CS-DRMS) මගින් ගෙවීම් සඳහා පුරෝකතනය කරන ලද අගයන් ණය ලබාදෙන නියෝජිතායතනයන්හි එම අගයන් සමග සංසන්දනය කිරීමේ දී වෙනසක් සිදුවේ නම් ඒ පිළිබඳ ආදාළ අංශය මගින් තහවුරු කරගැනීමට කටයුතු කිරීම.
- ප්‍රතිලබ්ධීන්, ණය වාරික ගෙවීම්, ණය නැවත ගෙවීම් සහ වෙනත් ගෙවීම් පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා කළමනාකරණ පද්ධතියට (CS-DRMS) ඇතුළත් කිරීම.
- නව ණය එකඟතාවයන්හි අදාළ එකඟතා සහ කොන්දේසීන්ගේ සාරාංශයක් සහ අදාළ එකඟතා ගිවිසුම්වල පිටපත් ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික විශ්ලේෂණ දෙපාර්තමේන්තුවට භාරදීම.
- ණය සංඛ්‍යානයන් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව සහ අදාළ නියෝජිතායතන වෙත නිකුත් කිරීම සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා කළමනාකරණ පද්ධතිය (CS-DRMS) මගින් ලබාගන්නා 814 වාර්තාව විදේශ සම්පත් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කිරීම.
- විදේශ ආධාර විමසුම, කාර්යසාධන වාර්තාව, අයවැයට අදාළ දෙපාර්තමේන්තු ප්‍රකාශය සහ වෙනත් ප්‍රකාශන සඳහා අවශ්‍ය පිළියෙල කිරීම් හා සම්බන්ධීකරණය කිරීම.
- විදේශ ණය ප්‍රදානයන්ට අදාළ විශ්ලේෂණ වාර්තා නියමිත කාලයන්හි අදාළ අංශ වෙත ලබාදීම.
- පාර්ලිමේන්තුව මගින් ණය සම්බන්ධව අසන ප්‍රශ්න සඳහා රජය වෙනුවෙන් විදේශ ණය සම්බන්ධ පිළිතුරු සැපයීම.
- පොදු රාජ්‍ය මණ්ඩලය විසින් නිර්මාණය කරන ලද "Horizon" නම් ණය කළමනාකරණ හා විශ්ලේෂණ පද්ධතියේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් විදේශ ණය ඇතුළත් කිරීම.
- විදේශ ණය සම්බන්ධ පැන නගින ගැටළු සඳහා මනා සම්බන්ධීකරණයක් ඇති කර ගැනිමට එම නියෝජිතායතන සහ දෙපාර්තමේන්තුවේ අදාළ අංශ සමඟ නිරන්තරයෙන් කටයුතු කිරීම.
- විදේශ මුල්‍යායනය සහ ණය සම්බන්ධයෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, මුදල් අමාත්‍යාංශ ලේකම් වෙතින් විවිධ ආයතන මගින් සිදු කරන ලබන ඉල්ලීම් සඳහා කටයුතු සිදු කිරීම.
- රටේ ණය කළමනාකරණ ධාරිතාව වැඩිදියුණු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සහ පොදු රාජ්‍ය මණ්ඩලීය කණ්ඩායම සමග නිරන්තර ක්‍රියාදාමයන්හි නිරත වීම.
- ලෝක බැංකුව, අන්තර් ජාතික මුල්‍ය අරමුදල මගින් විදේශ ණය සංඛ්‍යානයන්ට අදාළ දත්ත කාර්තුමය වශයෙන් ඉදිරිපත් කිරීම සහ ප්‍රකාශ කිරීම.

## 2014 වසරේ කාර්යසාධනය

- 2014 වසරේ සිදු වූ නව එකඟතාවයන්ට අදාළ උප ඇමුණුම් පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා කළමනාකරණ පද්ධතියට (CS-DRMS) ඇතුළත් කිරීම.
- 2014 වසර තුළ ණය ගිවිසුම් අනුව නියමිතව තිබූ නැවත ගෙවීම් වාරික ඇතුළු අනෙකුත් ගෙවීම් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත උපදේශ ඉදිරිපත් කෙරිණි.
- පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා කළමනාකරණ පද්ධතිය (CS-DRMS) මගින් ගෙවීම් සඳහා පුරෝකතනය කරන ලද අගයන් ණය ලබාදෙන නියෝජිතායතනයන්හි එම අගයන් සමග සංසන්දනය කිරීමේදී වෙනසක් සිදුවූ අවස්ථාවන්හි ණය එකඟතාවයන්ට අනුව ඒ පිළිබඳ අදාළ අංශය මගින් තහවුරු කරගැනිමට කටයුතු කිරීම.
- 2014 වසරේ සිදු වූ ප්‍රතිලබ්ධින්, ණය වාරික ගෙවීම්, ණය නැවත ගෙවීම් සහ වෙනත් ගෙවීම් පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා කළමනාකරණ පද්ධතියට (CS-DRMS) ඇතුළත් කිරීම.
- 2014 වසරේ සිදු වූ නව එකඟතාවයන්හි අදාළ එකඟතා සහ කොන්දේසි සකස්කොට පළ කිරීම.
- 2014 වසර සඳහා ණය සංඛ්‍යානයන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ අදාළ නියෝජිතායතන වෙත නිකුත් කිරීම සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා කළමනාකරණ පද්ධතිය (CS-DRMS) මගින් ලබාගන්නා 814 වාර්තාව විදේශ සම්පත් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කිරීම.
- 2014 වසර සඳහා විදේශ ආධාර විමසුම, කාර්යසාධන වාර්තාව, අයවැයට අදාළ දෙපාර්තමේන්තු ප්‍රකාශය සහ වෙනත් ප්‍රකාශන සඳහා අවශ්‍ය පිළියෙල කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- 2014 වසරේ පාර්ලිමේන්තුව මගින් ණය සම්බන්ධව අසන ප්‍රශ්න 5ක් සඳහා රජය වෙනුවෙන් විදේශ ණය සම්බන්ධ පිළිතුරු සැපයීම.
- පොදු රාජ්‍ය මණ්ඩලීය විසින් නිර්මාණය කරන ලද "Horizon" නම් ණය කළමනාකරණ හා විශ්ලේෂණ පද්ධතියේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් විදේශ ණය ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය දත්ත සපයන ලදි.
- විදේශ ණය සම්බන්ධ පැන නගින ගැටළු සඳහා මනා සම්බන්ධීකරණයක් ඇති කර ගැනීම සඳහා එම නියෝජිතායතන සහ දෙපාර්තමේන්තුවේ අදාළ අංශ සමඟ නිරන්තරයෙන් කටයුතු කිරීම.
- විදේශ මුල්‍යායතනය සහ ණය සම්බන්ධයෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, මුදල් අමාත්‍යාංශ ලේකම් වෙතින් විවිධ ආයතන මගින් සිදු කරන ලබන ඉල්ලීම් සඳහා අවශ්‍යතාව අනුව කාලානුරූපව කටයුතු සිදු කිරීම.
- 2014 වසර සඳහා විදේශ ණය සංඛ්‍යානයන්ට අදාළ දත්ත කාර්තුමය වශයෙන් ලෝක බැංකුව, අන්තර් ජාතික මූල්‍ය අරමුදලට ඉදිරිපත් කිරීම.

# ප්‍රතිපත්ති සැලසුම් අංශය

## ප්‍රතිපත්ති සැලසුම් අංශයේ කාර්යභාරය

රජයේ සංවර්ධන වැඩසටහන් මඟින් ප්‍රමුඛතා පදනම මත හඳුනා ගන්නා ලද සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා නව විදේශ මූල්‍ය ප්‍රභවයන් ආකර්ෂණය කර ගැනීම, නිල සංවර්ධන ආධාර උපයෝජනය හා කළමනාකරණය, විදේශ ආධාර සම්බන්ධීකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම යනාදී කාර්යයන් ඉටු කිරීම මෙම අංශයේ මූලික වගකීමයි:

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම අංශය මගින් පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලැබේ.

- රටේ සංවර්ධනය අරමුණු කරගනිමින් රජය විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන ව්‍යාපෘතීන් හා වැඩසටහන් සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශ හා සංවර්ධන පාර්ශ්වකරුවන් සම්බන්ධීකරණය කිරීම.
- රේඛීය අමාත්‍යාංශ මගින් සකස් කර මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම.
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලත් ව්‍යාපෘති යෝජනා සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ උපදෙස් පරිදි සුදුසු ආධාර ආයතනයන් වෙත යොමු කිරීම.
- විදේශ ආධාර මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත නව ව්‍යාපෘති යෝජනා මාලාව පිළියෙල කොට එය යාවත්කාලීන කිරීම හා නිසි පරිදි පවත්වාගෙන යාම.
- ප්‍රකාශන පිළියෙල කිරීම හා සම්බන්ධීකරණය කිරීම; කාර්යසාධන වාර්තාව, අයවැයට අදාළ දෙපාර්තමේන්තු ප්‍රකාශනය සකස් කිරීම.
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව සඳහා විදේශාධාර පරිච්ඡේදය සකස් කිරීම.
- විදේශ ආධාර උපයෝජනය සම්බන්ධ අදාළ චක්‍රලේඛ නිකුත් කිරීම.
- අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සඳහා දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ නියමිත වේලාවට ඉදිරිපත් කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- සංවර්ධන ආධාර කණ්ඩායම් සාකච්ඡා හා විදේශ ආධාර රැස්වීම් සම්බන්ධීකරණය කිරීම.
- විදේශ මූල්‍යායනයට අදාළ විශ්ලේෂණ වාර්තා නියමිත කාලයන්හි සතුටුදායක ලෙස සකස් කිරීම.

## 2014 වසරේ කාර්යසාධනය

- 2013 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව පිළියෙල කිරීම හා ප්‍රකාශයට පත් කිරීම.
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ 2013 වසර සඳහා වූ වාර්ෂික වාර්තාව සඳහා "විදේශාධාර" යන පරිච්ඡේදය පිළියෙල කිරීම
- රේඛීය අමාත්‍යාංශ මගින් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 68ක් අදාළ විදේශ ආධාර ප්‍රදායක අංශ වෙත යොමු කිරීම
- අවබෝධතා ගිවිසුම් 4ක් අත්සන් කිරීම සඳහා අනුමැතිය ලබාදීම
- විදේශ ආධාර ලබාගැනීම සම්බන්ධ චක්‍රලේඛයක් නිකුත් කිරීම
- විදේශ මූල්‍යායනයට අදාළ විශ්ලේෂණ වාර්තා නියමිත කාලයට සකස් කිරීම

# මූල්‍ය විග්‍රහය

## වියදම් පිළිබඳ මූල්‍ය තොරතුරු

මෙම දෙපාර්තමේන්තුව ආදායම් එක්රැස් කර දෙන ආයතනයක් ලෙස නොසැලකෙන අතර 2014 වර්ෂයේ අයවැය ශීර්ෂ අංක 239 යටතේ පුද්ගල පඩිනඩි, වෙනත් පුනරාවර්තන වියදම්, ප්‍රාග්ධන වියදම් සහ අත්තිකාරම් ගිණුම් මෙහෙයවීම්වලට අදාළව සලසා තිබූ මූල්‍ය ප්‍රතිපාදන සහ සත්‍ය වියදම් පහත වගුවලින් දැක්වේ.

**පුද්ගල පඩිනඩි**

| | රුපියල් |
|---|---|
| අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම | 40,900,000 |
| **එකතු කළා:** | |
| පරිපූරක ප්‍රතිපාදන | 5,204,000 |
| මු.රෙ. 66 හා 69 යටතේ මාරුකිරීම් | 71,840 |
| **අඩු කළා:** | |
| මු.රෙ. 66 යටතේ මාරුකිරීම් | - |
| **මුළු ප්‍රතිපාදන ප්‍රමාණය** | 46,175,840 |
| වසර තුළ වියදම | 46,174,213 |

**වෙනත් පුනරාවර්තන වියදම්**

| | රුපියල් |
|---|---|
| අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම | 215,000,000 |
| **එකතු කළා:** | |
| පරිපූරක ප්‍රතිපාදන | 3,794,000 |
| මු.රෙ. 66 හා 69 යටතේ මාරුකිරීම් | - |
| **අඩු කළා:** | |
| මු.රෙ. 66 යටතේ මාරුකිරීම් | (71,840) |
| **මුළු ප්‍රතිපාදන ප්‍රමාණය** | 218,722,160 |
| වසර තුළ වියදම | 138,702,484 |

ප්‍රාග්ධන වියදම

| වැය සංකේතය | වැය විෂයය | 2014 ඇස්තමේන්තුව රු. | 2014 ශුද්ධ ප්‍රතිපාදනය රු. | වියදම රු. |
|---|---|---|---|---|
| 2002 | යන්ත්‍ර හා උපකරණ පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 600,000 | 600,000 | 492,977 |
| 2003 | වාහන පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 1,000,000 | 1,000,000 | 653,545 |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ අත්පත් කර ගැනීම | 200,000 | 173,194 | 161,016 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම | 3,200,000 | 3,125,180 | 3,125,176 |
| 2204(21) | ආසියානු සංවර්ධන බැංකුව සාමාන්‍ය ප්‍රාග්ධන වර්ධනය | 521,000,000 | 521,000,000 | 516,481,703 |
| 2204-2- (11) | මාලදිවයිනෙහි මාර්ගයක් ඉදිකිරීම | 310,769,000 | 280,769,000 | 128,296,716 |
| 2204-3- (11) | උගන්ඩාවේ තාක්ෂණික පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම | 20,000,000 | 50,000,000 | 18,415,026 |
| 2204-5- (11) | ලෝක ආහාර සංවිධානයට ආහාර ආධාර සැපයීම | 400,000,000 | 400,000,000 | 219,839,869 |
| 2401 | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 1,100,000 | 1,201,626 | 1,201,625 |
| 2502 (17) | විදේශ නේවාසික ආයතනවල බදු ප්‍රතිපූර්ණය | 5,000,000 | 5,000,000 | 1,642,202 |
| 2502-4-(13) | විදේශ මාරුකිරීම් (ආයෝජන) | 9,380,000 | 9,380,000 | 0 |
| | **එකතුව** | **1,272,249,000** | **1,272,249,000** | **890,309,855** |

අයවැය ප්‍රතිපාදනයන් උපයෝජනයන් පිළිබඳ සාරාංශය

| වියදම් පිළිබඳ විස්තරය | 2014 ඇස්තමේන්තුව රු. | 2014 ශුද්ධ ප්‍රතිපාදන රු. | 2014 සත්‍ය වියදම රු. |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 255,900,000 | 264,898,000 | 184,876,697 |
| ප්‍රාග්ධන වියදම් | 1,272,249,000 | 1,272,249,000 | 890,309,855 |
| **එකතුව** | **1,528,149,000** | **1,537,147,000** | **1,075,186,552** |

# අත්තිකාරම් ගිණුම්

2014 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවෙහි රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි වේ.

| විස්තරය | අනුමත සීමාව රු. | වියදම රු. |
|---|---|---|
| වියදම් කිරීමේ උපරිම සීමාව | 4,500,000 | 4,497,735 |
| ලැබීමේ අවම සීමාව | 2,500,000 | 3,185,811 |
| හර ශේෂයේ උපරිම සීමාව | 30,000,000 | 18,154,668 |

# විගණන විමසුම්

2014 වර්ෂය තුළ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවෙන් විගණන විමසුම් 06ක් සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් විගණන විමසුම් 06ක් ලැබී ඇති අතර, සියළුම විමසුම් සඳහා පිළිතුරු යවා ඇත.

# විසර්ජන ගිණුම

2014 වර්ෂයට අදාළ විසර්ජන ගිණුම 2015 මාර්තු මස 31 වන දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

# 2014 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා අත්සන් කරන ලද විදේශ ණය මූල්‍යයන එකගතා ගිවිසුම් ලැයිස්තුව

| සංවර්ධන පාර්ශ්වකරුවන්/ ණය දෙන ආයතන | ගිවිසුම්ගත දිනය | ව්‍යාපෘතිය | ගිවිසුම්ගත විදේශ මුදල් ප්‍රමාණය | | | | වාර්ෂික පොලී අනුපාතිකය | | ආන්තිකය (100 පදනම් අංක) | පොරොන්දු ගාස්තු | වෙනත් ගාස්තු | සහන කාලය (අවුරුදු) | පරිණත කාලය (අවුරුදු) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ව්‍යවහාරික විනිමය | ප්‍රමාණය (මිලියන) | රුපියල් (මිලියන) | ඇ.ඩො (මිලියන) | පොලී වර්ගය | අනුපාතිකය | | | | | |
| **ද්විපාර්ශ්වීය** | | | | | | | | | | | | | |
| **ජපානය** | 28/03/2014 | කැළණි ගඟ මතින් නව පාලමක් ඉදිකිරීම | යෙන් | 35,040 | 44,808.10 | 342.8 | ස්ථාවර | කොටස 1 - 0.10%<br>කොටස 2- 0.01% | අදාළ නොවේ | _ | මූලික ගාස්තු (ණය මුදලින් (0.2% ක් එක්වරක් ගෙවනු ලබන) | 10 | 40 |
| | 23/08/2014 | භෞමික රූපවාහිනී විකාශන කටයුතු ඩිජිටල්කරණය කිරීම | යෙන් | 13717 | 17,199.76 | 132.1 | ස්ථාවර | කොටස 1–0.10%<br>කොටස 2 –0.01% | අදාළ නොවේ | | මූලික ගාස්තු (ණය මුදලින් 0.2%ක්, එකවරක් ගෙවනු ලබන | 10 | 40 |
| **චීන සංවර්ධන බැංකුව** | 11/03/2014 | ප්‍රමුඛතා මහාමාර්ග සංවර්ධනය සහ පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය 3 (අදියර- 1) | ඇ.ඩො. | 300 | 39,166.44 | 300 | විචල්‍ය | LIBOR 6 Months for USD | 2.95% | – | කළමනාකරණ ගාස්තු (ණය මුදලින් 0.5%ක්, එකවරක් | 3 | 15 |
| | 24/11/2014 | ප්‍රමුඛතා මහාමාර්ග සංවර්ධනය සහ පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය 3 (අදියර- 2) | ඇ.ඩො. | 100 | 13,100.00 | 100 | විචල්‍ය | LIBOR 6 Months for USD | 2.95% | – | කළමනාකරණ ගාස්තු (ණය මුදලින් 0.5%ක්, එකවරක් ගෙවනු ලබන) | 3 | 15 |
| **ප්‍රංශ සංවර්ධන ආයතනය** | 29/09/2014 | අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීමේ හා බලශක්ති ඉතිරුම් ව්‍යාපෘතිය සහ කොළඹ නැගෙනහිර ජල සම්පාදන ව්‍යාපෘතිය | ඇ.ඩො. | 70 | 9,124.50 | 70 | විචල්‍ය | LIBOR 6 Months for USD | 1.76% | 0.50% | මූලික ගාස්තු (ණය මුදලින් 0.5%ක්, එකවරක් ගෙවනු ලබන | 7 | 25 |
| **කොරියාව** | 30/12/2014 | දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය | ඇ.ඩො. | 58,155.00 | 7,622.83 | 58.15 | ස්ථාවර | 0.15% | අදාළ නොවේ | _ | _ | 10 | 40 |
| | 30/12/2014 | රුවැන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය | ඇ.ඩො. | 20.53 | 2,691.02 | 20.53 | ස්ථාවර | 0.15% | අදාළ නොවේ | _ | _ | 10 | 40 |
| **අරාබි ආර්ථික සංවර්ධනය සඳහා කුවේට් අරමුදල** | 30/01/2014 | පාලම් 25 සංවර්ධනය සහ පුනරුත්ථාපනය කිරීම | කුවේට් ඩිනාර් | 10 | 4,630.10 | 35.4 | ස්ථාවර | 2.00% | අදාළ නොවේ | 0.50% | _ | 5 | 25 |
| **අපනයන ණය** | | | | | | | | | | | | | |
| **KBC බැංකුව බෙල්ජියම** | 16/01/2014 | මොණරාගල - බුත්තල ජල සම්පාදන ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය | යූරෝ | 12.99 | 2,291.76 | 17.6 | ස්ථාවර | 1.20% | අදාළ නොවේ | 0.50% | - | 2.5 | 10 |
| **චීන ආනයන අපනයන බැංකුව** | 16/09/2014 | පිටත වටරවුම් අධිවේගී මාර්ගය අදියර 3 - ඉදිකිරීමේ ව්‍යාපෘතිය | ඇ.ඩො. | 494.03 | 64,363.19 | 494.03 | ස්ථාවර | 2.00% | අදාළ නොවේ | 0.25% | කළමනාකරණ ගාස්තු (ණය මුදලින් 0.25%ක්, එකවරක් ගෙවනු ලබන) | 5 | 20 |
| | 16/09/2014 | දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 4 වන කොටස (මත්තල සිට හම්බන්තොට) | යුවාන් | 2,528.17 | 53,585.87 | 411.4 | ස්ථාවර | 2.00% | අදාළ නොවේ | 0.25% | කළමනාකරණ ගාස්තු (ණය මුදලින් 0.25%ක්, එකවරක් ගෙවනු ලබන) | 5 | 20 |

# 2014 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා අත්සන් කරන ලද විදේශ ණය මූල්‍යයන එකඟතා ගිවිසුම් ලැයිස්තුව, ඉතිරිය....

| සංවර්ධන පාර්ශ්වකරුවන්/ ණයදෙන ආයතන | ගිවිසුම්ගත දිනය | ව්‍යාපෘතිය | ගිවිසුම්ගත විදේශ මුදල් ප්‍රමාණය | | | | වාර්ෂික පොලී අනුපාතිකය | | ආන්තිකය (100 පදනම් අංක) | පොරොන්දු ගාස්තු | වෙනත් ගාස්තු | සහන කාලය (අවුරුදු) | පරිණත කාලය (අවුරුදු) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ව්‍යවහාරික විනිමය | ප්‍රමාණය (මිලියන) | රුපියල් (මිලියන) | ඇ.ඩො (මිලියන) | පොලී වර්ගය | අනුපාතිකය | | | | | |
| චීන ආනයන අපනයන බැංකුව | 16/09/2014 | හම්බන්තොට ජාත්‍යන්තර කේන්ද්‍රය මාර්ග සහ ගුවන් පාලම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | යුවාන් | 1,555.99 | 32,980.10 | 253.2 | ස්ථාවර | 2.00% | අදාළ නොවේ | 0.25% | කළමනාකරණ ගාස්තු (ණය මුදලින් 0.25%ක්, එකවරක් ගෙවනු ලබන) | 5 | 20 |
| | 09/12/2014 | දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - කොටස I | ඇ.ඩො. | 684.00 | 89,538.03 | 683.49 | ස්ථාවර | 2.00% | අදාළ නොවේ | 0.25% | කළමනාකරණ ගාස්තු (ණය මුදලින් 0.25%ක්, එකවරක් ගෙවනු ලබන) | 5 | 20 |
| එක්සත් ජනපද Deutsche Bank | 10/10/2014 | ග්‍රාමීය යකඩ පාලම් 537ක් ඉදිකිරීම | ඇ.ඩො. | 161.2 | 21,074.17 | 161.7 | විචල්‍ය | LIBOR 6 Months for USD | 1.5% (export Credit) 4.15 % (commercial credit) | 0.25% | සැකසුම් ගාස්තු (ණය මුදලින් 0.5%ක්, එකවරක් ගෙවනු ලබන) | 3 | 13 |
| නෙදර්ලන්තයේ Co-op Centrale Raiffeisen-Boerenleenbank ආයතනය | 10/10/2014 | කිරි ගවයින් ආනයනය කිරීම II අදියර | ඇ.ඩො. | 17.6 | 2,298.09 | 17.6 | විචල්‍ය | LIBOR 6 Months for USD | 2.00% | 0.25% | කළමනාකරණ ගාස්තු (ණය මුදලින් 0.25%ක්, එකවරක් ගෙවනු ලබන) | 2 | 10 |
| | 14/11/2014 | කිරි ගවයින් ආනයනය කිරීම III අදියර | ඇ.ඩො. | 3.1 | 407.52 | 3.1 | ස්ථාවර | 5.00% | අදාළ නොවේ | 0.25% | කළමනාකරණ ගාස්තු (ණය මුදලින් 0.25%ක්, එකවරක් ගෙවනු ලබන) | 2.5 | 3.5 |
| | 05/12/2014 | ග්‍රාමීය යකඩ පාලම් 463ක් ඉදිකිරීම | යූරෝ | 105 | 17,026.93 | 129.95 | විචල්‍ය | LIBOR 6 Months for USD | 1.45% (export Credit) 4% (commercial credit) | 0.25% | කළමනාකරණ ගාස්තු (ණය මුදලින් 0.5%ක්, එකවරක් ගෙවනු ලබන) | 2.5 | 12.5 |
| බහුපාර්ශ්වීය | | | | | | | | | | | | | |
| ආසියානු සංවර්ධන බැංකුව | 27/05/2014 | නිපුණතා ආංශීය වැඩිදියුණු කිරීමේ වැඩසටහන | ඇ.ඩො. | 50 | 6,520.70 | 50 | විචල්‍ය | LIBOR 6 Months for USD | 0.60% | 0.15% | - | 5 | 26 |
| | 27/05/2014 | නිපුණතා ආංශීය වැඩිදියුණු කිරීමේ වැඩසටහන | වි.ගැ.හි | 32.6 | 6,597.71 | 50.6 | ස්ථාවර | 2.00% | අදාළ නොවේ | - | - | 5 | 25 |
| | 27/05/2014 | දක්ෂිණ මාර්ග සම්බන්ධීකරණ ව්‍යාපෘතිය | ඇ.ඩො. | 70 | 9,129.06 | 70 | විචල්‍ය | LIBOR 6 Months for USD | 0.60% | 0.15% | - | 5 | 26 |
| | 27/05/2014 | දක්ෂිණ මාර්ග සම්බන්ධීකරණ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 3.32 | 673.8 | 5.2 | ස්ථාවර | 2.00% | අදාළ නොවේ | - | - | 5 | 25 |
| | 03/06/2014 | මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදනය ඉහළ නැංවීම සහ අපජල කළමනාකරණය ව්‍යාපෘතිය II | ඇ.ඩො. | 70 | 9,124.70 | 70 | විචල්‍ය | LIBOR 6 Months for USD | 0.60% | 0.15% | - | 5 | 26 |
| | 03/06/2014 | මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදනය ඉහළ නැංවීම සහ අපජල කළමනාකරණය ව්‍යාපෘතිය II | වි.ගැ.හි | 11.83 | 2,376.90 | 18.2 | ස්ථාවර | 2.00% | අදාළ නොවේ | - | - | 5 | 25 |
| | 05/11/2014 | ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන අදියර I | වි.ගැ.හි | 64.77 | 12,527.88 | 95.74 | ස්ථාවර | 2.00% | අදාළ නොවේ | - | - | 5 | 25 |

## 2014 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා අත්සන් කරන ලද විදේශ ණය මූල්‍යයන එකඟතා ගිවිසුම් ලැයිස්තුව, ඉතිරිය....

| සංවර්ධන පාර්ශ්වකරුවන්/ ණය දෙන ආයතන | ගිවිසුම්ගත දිනය | ව්‍යාපෘතිය | ගිවිසුම්ගත විදේශ මුදල් ප්‍රමාණය | | | | වාර්ෂික පොලී අනුපාතිකය | | ආන්තිකය (100 පදනම් අංක) | පොරොන්දු ගාස්තු | වෙනත් ගාස්තු | සහන කාලය (අවුරුදු) | පරිණත කාලය (අවුරුදු) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ව්‍යවහාරික විනිමය | ප්‍රමාණය (මිලියන) | රුපියල් (මිලියන) | ඇ.ඩො (මිලියන) | පොලී වර්ගය | අනුපාතිකය | | | | | |
| ආසියානු සංවර්ධන බැංකුව | 20/11/2014 | හරිත බලශක්ති සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන | වි.ගැ.හි | 18.76 | 3,630.29 | 27.7 | ස්ථාවර | 2.00% | අදාළ නොවේ | - | - | 5 | 25 |
| | 20/11/2014 | හරිත බලශක්ති සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන | ඇ.ඩො. | 121 | 15,851.00 | 121 | විචල්‍ය | LIBOR 6 Months for USD | 0.60% | 0.15% | - | 5 | 26 |
| ලෝක බැංකුව - සංවර්ධනය හා ප්‍රතිසංස්කරණය සඳහා වූ අන්තර්ජාතික බැංකුව | 10/07/2014 | හදිසි දේශගුණික ආපදා සඳහා වන විශේෂ ණය වැඩසටහන සඳහා ලෝක බැංකුවේ ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය උදෙසා වන ව්‍යාපෘතිය | ඇ.ඩො. | 102 | 13,282.50 | 102 | විචල්‍ය | LIBOR 6 Months for USD | 0.63% | - | - | 3 | 20 |
| ලෝක බැංකුව - අන්තර්ජාතික සංවර්ධන සංගමය | 10/07/2014 | දේශගුණික අවබලපෑම් අවම කිරීමේ වැඩසටහන | වි.ගැ.හි | 71.7 | 14,442.70 | 110.9 | ස්ථාවර | 1.25% | අදාළ නොවේ | 0.50% | සේවා ගාස්තු (0.75%) | 5 | 25 |
| | 12/09/2014 | උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය | වි.ගැ.හි | 95 | 18,780.36 | 144.2 | ස්ථාවර | 1.25% | අදාළ නොවේ | 0.50% | සේවා ගාස්තු (0.75%) | 5 | 25 |
| | 12/09/2014 | ජලවේලි සුරැකුම් සහ ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙහි අතිරේක මූල්‍යයන අවශ්‍යතාව | වි.ගැ.හි | 53.7 | 10,615.84 | 81.5 | ස්ථාවර | 1.25% | අදාළ නොවේ | 0.50% | සේවා ගාස්තු (0.75%) | 5 | 25 |
| | 12/09/2014 | නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය (B කොටස) | වි.ගැ.හි | 14.1 | 2,787.4 | 21.4 | ස්ථාවර | 1.40% | අදාළ නොවේ | 0.50% | සේවා ගාස්තු (0.75%) | 5 | 25 |
| | 12/09/2014 | නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය (A කොටස) | වි.ගැ.හි | 51.6 | 10,200.70 | 78.3 | ස්ථාවර | 1.25% | අදාළ නොවේ | 0.50% | සේවා ගාස්තු (0.75%) | 5 | 25 |
| **වාණිජ බැංකුව** | | | | | | | | | | | | | |
| ජාත්‍යන්තර බැදුම්කර නිකුතුව | 01/01/2014 | බැදුම්කර නිකුතුව | ඇ.ඩො. | 1,000.00 | 130,681.10 | 1,000.00 | ස්ථාවර | 6.00% | අදාළ නොවේ | - | - | - | 5 |
| | 07/04/2014 | බැදුම්කර නිකුතුව | ඇ.ඩො. | 500 | 65,281.20 | 500.00 | ස්ථාවර | 5.13% | අදාළ නොවේ | - | - | - | 5 |
| | | | **එකතුව** | | **754,412.3** | **5,777.8** | | | | | | | |

*__සටහන:__1. LIBOR = ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය, (2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා, සාමාන්‍ය සය මාසික LIBOR අනුපාතය සියයට 0.33 කි)*

*2. EURIBOR=යුරෝපීය අන්තර් බැංකු අර්පණ අනුපාතිකය, (2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා, සාමාන්‍ය සය මාසික EURIBOR අනුපාතය සියයට 0.27කි)*

*3. ඒ ඒ විදේශ විනිමයෙන් සිදු වූ ප්‍රතිලබ්ධීන්, රුපියල් හා ඇමරිකා ඩොලර්වලින් ගණනය කිරීමේ දී, ඒ ඒ ප්‍රතිලබ්ධිය සිදුවූ දිනට අදාළ විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත.*

*4. රජය සතු ව්‍යාපාර විසින් ලබාගත් විදේශ ණය එකඟතාවයන් මෙහි අන්තර්ගත නොවේ.*

*5. වි.ගැ.හි.= විශේෂ ගැනුම් හිමිකම්*

## වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා අත්සන් කරන ලද විදේශ ප්‍රදාන මූල්‍යයන එකඟතා ගිවිසුම් ලැයිස්තුව

| සංවර්ධන පාර්ශ්වකරුවන්/ ණය දෙන ආයතන | අත්සන් කළ දිනය | ව්‍යාපෘතිය | ගිවිසුම්ගත විදේශ මුදල් ප්‍රමාණය | | | |
|---|---|---|---|---|---|---|
| | | | ව්‍යවහාරික විනිමය | ප්‍රමාණය (මිලියන) | රුපියල් (මිලියන) | ඇ.ඩො. (මිලියන) |
| **ද්විපාර්ශ්වීය** | | | | | | |
| **ජපානය** | 11/3/2014 | ජපාන ව්‍යාපෘති නොවන ආධාර ප්‍රධාන යටතේ උසස් තත්ත්වයේ ජපන් නිෂ්පාදන (වෛද්‍ය උපකරණ හා සුඛසාධන උපකරණ) සම්පාදනය කිරීම | යෙන් | 500 | 631.60 | 4.84 |
| | 26/11/2014 | ජපාන ව්‍යාපෘති නොවන ආධාර යටතේ ජපාන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන සම්පාදනය කිරීමේ ආධාර-2014 | යෙන් | 200 | 222.36 | 1.69 |
| | 02/06/2014 | මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව-2014 | යෙන් | 215 | 274.75 | 2.11 |
| **පාකිස්තානය** | 23/06/2014 | මධ්‍යම පළාත-සෞඛ්‍ය සේවාවන් | ඇ.ඩො | 0.017 | 2.21 | 0.017 |
| | 28/05/2014 | උතුරු පළාතේ අභ්‍යන්තර අවතැන්වූවන් සඳහා නිවාස 220 ගොඩනැංවීම | ඇ.ඩො | 0.98 | 128.80 | 0.99 |
| **බහුපාර්ශ්වීය** | | | | | | |
| **ආහාර සහ කෘෂිකර්ම සංවිධානය** | 07/01/2014 | Quinoa වගාව හඳුන්වාදීම මගින් ආහාර සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීමට තාක්ෂණික සහාය ලබාදීම | ඇ.ඩො | 0.12 | 16.07 | 0.12 |
| | 12/02/2014 | සාර්ක් රටවල්වල ගෙවතුවගා දාමයන්හි පසු අස්වනු හානි අවම කිරීම | ඇ.ඩො | 0.48 | 63.70 | 0.49 |
| | 27/03/2014 | කිරි නිෂ්පාදනය සඳහා සුදුසු පෝෂණ තාක්ෂණයක් ප්‍රවර්ධනය කිරීම | ඇ.ඩො | 0.27 | 35.81 | 0.27 |
| | 29/08/2014 | ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් වැඩිදියුණු කිරීම. (කුඩා මසුන්) | ඇ.ඩො | 0.34 | 44.92 | 0.34 |
| **එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන** | 18/06/2014 | ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාසයන් නිසා ඇතිවන පසු අවදානම යථා තත්ත්වයට පත්කිරීම සහ සංවර්ධනය | ඇ.ඩො | 2.03 | 265.41 | 2.04 |
| | 25/06/2014 | ක්‍රමෝපාය සහාය-විධිමත් අපද කළමනාකරණ වැඩසටහන 2014-2018 | ඇ.ඩො | 3.00 | 390.00 | 3.00 |
| **ලෝක ආහාර සංවිධානය** | 05/08/2014 | අවබෝධාත්මක ආපදා කළමනාකරණ වැඩසටහන* | ඇ.ඩො | 23.48 | 3,058.07 | 23.48 |
| **ලෝක බැංකුවේ අන්තර්ජාතික සංවර්ධන සමායතනය** | 27/05/2014 | පාසල් අධ්‍යාපන දැනුම කේන්ද්‍ර කරගත් අධ්‍යාපන ක්‍රමයකට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය-අතිරේක මූල්‍යයනය | ඇ.ඩො | 6.11 | 797.35 | 6.11 |
| | 09/12/2014 | පාසල් අධ්‍යාපන දැනුම කේන්ද්‍ර කරගත් අධ්‍යාපන ක්‍රමයකට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය-අතිරේක මූල්‍යයනය | ඇ.ඩො | 10.29 | 1,349.34 | 10.3 |
| | 08/05/2014 | උතුරු-නැගෙනහිර පළාත් පාලන සේවාවන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | ඇ.ඩො | 18.8 | 2,455.28 | 18.8 |
| | 05/08/2014 | අතිරේක මූල්‍යයනය-උතුරු-නැගෙනහිර පළාත් පාලන සේවාවන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | ඇ.ඩො | 1.5 | 195.34 | 1.5 |
| | 11/7/2014 | ආපද අවමකිරීම සහ යථා තත්ත්වයට පත්කරගැනීම සඳහා ආපද අවදානම් කළමනාකරණ වැඩසටහන | ඇ.ඩො | 0.42 | 54.69 | 0.42 |
| | | **එකතුව** | | | **9,985.70** | **76.52** |